# පළාපත්වල එල්ලංගා පැතිකඩ හා එල්ලංගා කළමනාකරණ සැලැස්ම




**කෘෂිකර්ම අමාත්‍යාංශය**

**දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය**

**නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂක කාර්යාලය – වයඹ පළාත**

# පටුන


පටුන ........................................................................................................ 2

01. හැඳින්වීම ........................................................................................................ 4

01.01. එල්ලංගා පද්ධති කළමනාකරණය ........................................................ 5

01.02. එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීම ............................................ 6

01.03.එල්ලංගා කලමණාකරන කමිටුවක අවශ්‍යතාවය ................................... 8

01.04. එල්ලංගා පැතිකඩක් සකස්කිරීමේ අවශ්‍යතාවය ................................... 9

01.05. එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස්කිරීමේ අරමුණු ........... 9

01. 07. එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය ............ 11

02. පලාපත්වල එල්ලංගා පද්ධතිය ........................................................ 13

02.01. අඹන්පොල භූගෝලීය පිහිටීම ............................................................ 14

02.02. පලාපත්වල එල්ලංගාව ........................................................................ 15

02.03. ජල විද්‍යාත්මක පදනම ........................................................................ 17

02.04. ඉඩම් පරිහරණ රටාව ........................................................................ 18

02.05. සමාජ ආර්ථික පසුබිම ........................................................................ 19

02.06. කෘෂිකාර්මික භෝග රටාව ................................................................ 19

02.07.පරිසර විද්‍යාත්මක පසුබිම ................................................................ 21

3.පළාපත්වල එල්ළංගාව තිරසර ලෙස කළමනාකරණය කිරීමේ වැදගත්කම ................................ 23

03.01. එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය ............ 23

04. එල්ලංගාව මුහුණදෙන මූලික අභියෝග හඳුනාගැනීම ............................................ 25

04.01.උග්‍ර ගැටළු විසඳීම/ අවම කිරීම සඳහා යෝජිත උපාය මාර්ගික මැදිහත්වීම් ........................ 26

04.02. උග්‍ර ගැටළු විසඳීම/ අවම කිරීම සඳහා යෝජිත ක්‍රියාකාරී සැලැස්ම ................................ 33

ඇමුණුම් ........................................................................................................ 34

වගු ලේඛනය

වගුඅංක 01 - අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වී වගාව සඳහා ජලය ලබාගන්න ආකාරය ........................................................................................................................14
වගුඅංක 02 - එල්ළංගාව පිළිබඳ සාමාන්‍ය තොරතුරු .....................................................................15
වගුඅංක 03 - ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් පළාපත්වල එල්ලංගාව ......................................16
වගුඅංක 04 - කලාපයේ උෂ්නත්ව අගයන් මාසිකව ......................................................................17
වගුඅංක 05 - වර්ෂාපතනය අගයන් (මිලි මීටර).............................................................................17
වගුඅංක 06 - ඉඩම් පරිහරණ රටාව (ප්‍රමාණයන් අක්කර වලින්) ....................................................18
වගුඅංක 07 -පලාපත්වල එල්ලංගාවට අයත් වැව් හා ගොවි සංවිධාන............................................20
වගුඅංක 08 - පළතුරු භෝග වගාව ..............................................................................................22
වගුඅංක 09 - පලාපත්වල එල්ලංගාවට අයත් වැව්.........................................................................22
වගුඅංක 10 - උග්‍ර ගැටළු විසඳීම සඳහා යෝජිත උපාය මාර්ගික මැදිහත්වීම .................................. 25
වගුඅංක 11 - උග්‍ර ගැටළු විසඳීම / අවම කිරීම සඳහා යෝජිත ක්‍රියාකාරී සැලැස්ම ............................33

රූප සටහන් ලේඛනය

රූපසටහන 01 - එල්ලංගාවක සාමාන්‍ය ස්වරූපය........................................................................5
රූපසටහන 02 - එල්ලංගා කළමනාකරණයට අදාළ ආයතනික රාමුව ............................................7

# 01. හැඳින්වීම

ප්‍රාථමික ජල මාර්ගයක හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති ජල විද්‍යාත්මක ලෙස එකට බැඳුනු කුඩා හා මධ්‍ය පරිමාණයේ වැව් පද්ධති හෝ කුඩා වැව්,මධ්‍ය ප්‍රමාණයේ වැව් සහ අමුණු පද්ධති, වලින් සමන්විත වූ ද්විතිය හා තෘතිය ජල මාර්ගයකට ජලය මුදා හරිනු ලබන මධ්‍ය ජල ධාරා ප්‍රදේශය එල්ලංගාව ලෙස හදුන්වනු ලබයි.එල්ලංගාව අපගේ වාරි ශිෂ්ඨාචාරයේ විශිෂ්ඨ නිර්මාණයක් වන අතර එමගින් මුලු පරිසර පද්ධතියේම තිරසාර පැවැත්ම තහවුරු කරයි.

වාරි ශිෂ්ඨාචාරයේ ඉතාමත් විශිෂ්ඨ නිර්මාණයක් වන එල්ලංගාව ආරක්ෂා කර සංරක්ෂණය කර මනා කලමණාකරනයක් තුලින් ''දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය'' මගින් සංවර්ධන කටයුතු තිරසර ලෙස පවත්වා ගෙන යාම සඳහා එල්ලංගා කලමණාකරනය පහසු කිරීමට ව්‍යාපෘති ප්‍රතිලාභීන්ගෙන් සහ සියලුම රාජ්‍ය හා පෞද්ගලික ආයතන වලින් සමන්විත එල්ලංගා කලමණාකරන කමිටු පිහිටු වීමට ලෝක බැංකු ආධාර යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබයි. මේ සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් මග පෙන්වීම සිදුකරයි . එල්ලංගාවේ සියලු පාර්ශවයන්ගේ සහබාගිත්වයෙන් එහි සියලු සම්පත් මනාව කලමණාකරනය කිරීම එල්ලංගා කලමණාකරණ කමිටුවල මූලික වගකීම වන අතර එම කාර්යය පහසු කිරීම සඳහා අවශ්‍ය සැලසුමක් සැකසීමට අවශ්‍ය තොරතුරු එකතු කිරීම සඳහා එල්ලංගා පැතිකඩක්(Profile)පළාතේ සෑම එල්ලංගාවක් සඳහාම සකස් කරනු ලබයි.එල්ලංගා කලමණාකරන කමිටුව හරහා එල්ලංගාව හා ජලධාරා ප්‍රදේශය ආරක්ෂා කිරීමේ අපේක්ෂාවෙන් සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කලමණාකරන සැලැස්ම සකස් කර ඇත.එල්ලංගා පැතිකඩක් සැකසීමේ ප්‍රධාන අපේක්ෂාව වන්නේ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සැකසීමයි.

## 01.01.එල්ලංගා පද්ධති කළමනාකරණය

ජලය මිනිස් ජීවිතයේ වැදගත්ම අත්‍යවශ්‍ය මූලිකාංගයක් වන අතර එය මිනිසාගේ, සෙසු ජීවීන්ගේ සහ වෘක්ෂලතා ආදිය ඇතුලත් සමස්ත පරිසර පද්ධතියේ පැවැත්මේ මූලිකාංගයවේ. ආහාර සුරක්ෂිතතාවය, ජීවනෝපාය හා ග්‍රාමීය ජනතාවගේ සමස්ත පැවැත්ම ජලය මත රඳාපවතී. කෘෂිකර්මය පදනම්කරගත් ග්‍රාමීය ආර්ථිකය තුල සුළු පරිමාණ ගොවිජනතාවගේ ජීවිත වල පැවැත්ම හා සමස්ත ජනජීවිතය ජලය මතරඳා පවතී.

ජල කළමණාකරනයට අදාලව ශ්‍රී ලංකාවේ ඉතිහාසය විමසා බලන විට ගංගා ඇළදොළ හරස්කර ජලය ලබාගෙන නිර්මාණය කරන ලද වාරිමාර්ග පද්ධතීන්ට ප්‍රථමයෙන් වර්ෂාපෝෂිත ගොවිතැනෙන් යැපුණු ගොවීන් එකිනෙකට සම්බන්ධ කුඩාවැව් වල වැවෙන් වැවට ජලය ලබා ගනිමින් එල්ලංගා පද්ධති ක්‍රමයකට අවතීර්ණවූ බව අපට පෙන්වාදෙයි.

එකිනෙක මත යැපෙන එකිනෙකට සම්බන්ධ සීමිත පෝෂිත ප්‍රදේශයක් තුල පිහිටා ඇති කුඩා පරිමාණයේ වැව් පද්ධතියක් එල්ලංගා පද්ධතියක් ලෙස හඳුන්වනු ලැබේ. ජලය සංරක්ෂණය, ගබඩාකිරීම, බෙදාහැරීම හා පරිහරණයට අදාලව සාමූහිකව තීරණගන්නා සුවිශේෂී පද්ධතියක් වන එල්ලංගාවක් මගින් ගොවිතැන්, සත්වපාලනය, ගෘහස්ත පරිභෝජනය, මෙන්ම පරිසර පද්ධතිය සුරැකීමද අපේක්ෂා කෙරේ.

ප්‍රාථමික ජල මාර්ගයක හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති ජල විද්‍යාත්මක ලෙස එකට බැඳුනු කුඩා හා මධ්‍ය පරිමාණයේ වැව් පද්ධති හෝ කුඩා වැව්,මධ්‍ය ප්‍රමාණයේ වැව් සහ අමුණු පද්ධති, වලින් සමන්විත වූ ද්විතීය හා තෘතීය ජල මාර්ගයකට ජලය මුදා හරිනු ලබන මධ්‍ය ජල ධාරා ප්‍රදේශය එල්ලංගාව ලෙස හඳුන්වනු ලබයි.එල්ලංගාව අපගේ වාරි ශිෂ්ඨාචාරයේ විශිෂ්ඨ නිර්මාණයකි. එමගින් මුළු පරිසර පද්ධතියේම තිරසර පැවැත්ම තහවුරු කරයි.

වාරි ශිෂ්ඨාචාරයේ මෙම මාහැඟිඅමිල නිර්මාණයක් වන එල්ලංගාව සංරක්ෂණය කර මනා කලමණාකරනයක් තුලින් “දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ” සංවර්ධන කටයුතු තිරසර ලෙස පවත්වා ගෙන යාම සඳහා එල්ලංගා කලමණාකරනය පහසු කිරීමට ව්‍යාපෘති ප්‍රතිලාභීන්ගෙන් සහ සියලුම රාජ්‍ය හා පෞද්ගලික ආයතන වලින් සමන්විත එල්ලංගා කලමණාකරන කමිටු පිහිටු වීමටරජය මගින් දැනට ක්‍රියාත්මන වන දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය කටයුතු කරනු ලබයි. එල්ලංගාවේ සියලු පාර්ශව එකතු වී සියලු සම්පත් මනාව කලමණාකරනය කිරීම එල්ලංගා කලමණාකරන කමිටුවල මූලික වගකීම වන අතර එම කාර්යය පහසු කිරීම සඳහා අවශ්‍ය සැලසුමක් සැකසීමට අදාල තොරතුරු එකතු කිරීම සඳහා එල්ලංගා පැතිකඩක් (Profile) පළාතේ සෑම එල්ලංගාවක් සඳහාම සකස් කරනු ලබයි.

රූප සටහන 01 - එල්ලංගාවක සාමාන්‍ය සවරූපය




## 01.02. එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීම

එල්ලංගා කළමණාකරන කමිටුව හරහා එල්ලංගාව හා ජලධාරා ප්‍රදේශය ආරක්ෂා කිරීමේ අපේක්ෂාවෙන් සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කළමණාකරන සැලැස්ම සකස් කරනු ලබන අතර එල්ලංගා පැතිකඩක් සැකසීමේ ප්‍රධාන අපේක්ෂාව වන්නේ ඒ සඳහා අවශ් සියලු තොරතුරු ලබා ගැනීමයි. සාමාන්‍ය වශයෙන් එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කර ඒ මගින් ක්‍රියාත්මක විය යුතුය.
එල්ලංගා පද්ධතියක් යනු අතීතයේ සිට වැව් කලමණාකරනයේදී භාවිතා කරන ලද සාම්ප්‍රදායික ජල කලමණාකරන ක්‍රමවේදයකි.එල්ලංගාව යන වචනය සිංහල භාෂාවේ වචන දෙකක් එකතු වී සකස් වී ඇත.එනම්,"එල්ලන්" සහ "ගාව" යන්නයි. එල්ලන් යනු එල්ලෙන යන්නයි. ගාව යනු එකකට පසු අනෙක් ඒවා යන්නයි. එල්ලංගාව යන වචනයේ අදහස වනුයේ ඉහල සිට පහළට එකිනෙකට සම්බන්ධිත ලඟින් පිහිටි වැව් පද්ධතියක් යන්නයි. ශ්‍රී ලංකාවේ මෙම වාරි තාක්ෂණ එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් ලෝක උරුමයක් ලෙස නම් කර ඇත. එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීමේ අදහස වනුයේ දශක කිහිපයකට පෙර පැවති ලෙස එල්ලංගාව පවත්වාගෙන යාම සහ එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීමට, නීතිගත කිරීමට සම්බන්ධිත සියලුම පාර්ශවකරුවන් පොදු සංසදයක් ලෙස වැඩ කර එල්ලංගාව ආරක්ෂා කිරීමට කටයුතු කිරීමයි. පරිපාලන දිස්ත්‍රික්ක 11ක අදාල ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටු වල සභාය ඇතිව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 06/2023 දරන චක්‍ර ලේඛනය අනුව (ඇමුණුම 01) එල්ලංගා කළමණාකරන කමිටු 53ක් පිහිටුවීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ. ලෝක බැංකු මූල්‍ය ආධාර මත කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ අදාල පාර්ශවකරුවන් සමඟ සමීපව කටයුතු කර එල්ලංගා කළමණාකරන කමිටු 53 පිහිටුවීමේ සමස්ථ ක්‍රියාවලිය සඳහා සභාය ලබාදේ.

එල්ලංගා කලමණාකරන කමිටු සාමාජිකත්වය පහත ආයතන නියෝජිතයින්ගෙන් සමන්විතවේ. ඒවා නම්

- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
- පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව
- පළාත් සහ අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- ප්‍රාදේශීය ලේකම්වරු
- ගොවි සංවිධාන, ප්‍රජා මූලික සංවිධාන
- ජල සම්පත් මණ්ඩලය
- ආපදා කළමණාකරන කාර්යාංශය
- පොලිස් දෙපාර්තමේන්තුව
- ජාතික ජලජ ජීවී සංවර්ධන අධිකාරිය
- පරිසර අධිකාරිය, පෞද්ගලික අංශය
- ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුවයන ආයතන වේ.

එල්ලංගා කළමණාකරන කමිටුවක මූලික වගකීම වනුයේ එල්ලංගාව ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහාසුදුසු ක්‍රියාමාර්ග ගැනීම සහ උපාය මාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමයි. රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය,ප්‍රජා මුල සංවිධාන ඇතුලු පාර්ශවකරුවන් රාශියකට එල්ලාංගාව ආරක්ෂා කිරීමේ හා කළමනාකරණ කිරීමේ වගකීම පැවරී ඇත.

ප්‍රධාන පාර්ශවකරුවන් පහත රූප සටහනේ  දක්වා ඇත.

රූප සටහන 02- එල්ලංගා කළමනාකරණයට අදාළ ආයතනික රාමුව




## 01.03.එල්ලංගා කලමණාකරන කමිටුවක අවශ්‍යතාවය

මෙරට ඒකාබද්ධ කළමණාකරණවැඩ සටහන් කිහිපයක් ක්‍රියාත්මක වෙමින් පවතී. ඉන් මහ වැලි ව්‍යාපාරයහා ඉන්මාස් වැඩ සටහන ප්‍රමුඛතාවය ගනී. මෙම වැඩසටහන් ජාලය හා බැඳුනු මහා වාරිමාර්ග පදම් කරගත් ව්‍යාපාර වේ. මෙම වැඩ සටහන් අතුරෙන් 1984 ආරම්භ වූ ඉන්මාස් වැඩ සටහන (මහා වාරිමාර්ග පුණරුත්ථාපන වැඩ සටහන MIRP හා වාරිමාර්ග පද්ධති කළමනාකරණ වැඩ සටහන් ISMP ව්‍යාපෘති ) වැදගත් තැනක් ගනු ලබන්නේ එයද ලෝක බැංකු වේ අනුග්‍රහයෙන් මෙරට ක්‍රියාත්මක වී අද දක්වාම සාර්ථකව ක්‍රියාත්මක වන බැවිනි. මෙරට මහ ගොවි ජනපද ව්‍යාපාර වල ගොවි සංවිධාන පිහිටු වීමේ ආරම්භක පියවරක් ගනු ලැබුවේ මෙම ඉන්මාස් වැඩ සටහන තුලින්ය. මෙම ගොවි ජන පද ව්‍යාපාර කළමනාකරණය කිරීම ව්‍යාපාර කළමනාකරණ කමිටුව මගින් සිදු වේ. මෙම එල්ලංගාව කළමනාකරණය කිරීම ද එල්ලංගා කළමනාකරණ කමිටුව මගින් ඉටු කිරීමට ලෝක බැංකුව අපේක්ෂා කරයි. ඉහතින් කියවෙන ව්‍යාපාර කළමනාකරණ කමිටුව හා මෙම එල්ලංගා කළමනාකරණ කමිටුව බොහෝ දුරට සමානකම් දක්වයි. මෙහි කළමනාකාරිත්වයරජයේ නිලධාරින්ගේ හා එල්ලංගාවේ ප්‍රතිලාභීන් හවුල් කරගෙන හවුල් කළමනාකරණයක් දක්වා ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කරයි. ඉහත අංක 01.02කොටසට අනුව මෙම එල්ලංගා කළමනාකරණ කමිටුවේ අන්තර්ගතය සටහන් කර ඇත. ඉතා වේගවත්ව හායනයට යමින් පවතින ලෝක උරුමයක් ලෙස හඳුනාගෙන ඇති එල්ලංගාවනැවතත් තිරසරව පවත්වාගෙන යාමට මෙම එල්ලංගා කළමනාකරණ කමිටුව බෙහෙවින් ඉවහල් වනු ඇත.

## 01.04. එල්ලංගා පැතිකඩක් සකස් කිරීමේ අවශ්‍යතාවය

එල්ලංගාව පවත්වාගෙන යාම සඳහා අතීතයේ පැවති ග්‍රාමීය ආයතන ව්‍යුහය හා සමාජ ආර්ථික වත් පිලිවෙත්,සාම්ප්‍රදායන් හා චාරිත්‍ර වාරිත්‍ර නිසා එල්ලංගාවේ තිරසර පැවැත්ම තහවුරු වූ අතර ක්‍රමානුකූලව මෙම තත්වයන් වෙනස් වීමත් සමග එල්ලංගා පද්ධතිය හායනයට පත් විය. වර්තමානය වන විට එය ඉතාමත් වේගයෙන් හායනයට ලක් වෙමින් පවතී. එල්ලංගා පද්ධති නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමේදී, සම්පත් හායනය වලක්වා ගැනීමේදී හා මනා කලමණාකරනයක් කිරීමේදී එල්ලංගාවේ වර්තමාන තත්වය සහ පවතින ගැටළු හා ඒවා අතර ඇති වඩාත් උග්‍ර ගැටළු හඳුනා ගැනීම ඉතාමත් වැදගත් වේ. මේ සඳහා එල්ලංගාවේ භූගෝලීය ගැටළු, ජල විද්‍යාත්මක ගැටළු, පරිසර විද්‍යාත්මක ගැටළු හා සමාජ ආර්ථික ගැටළු හඳුනා ගත යුතු වේ.එසේම එල්ලංගාව තුල වර්තමානයේ සිදුවන මානව ක්‍රියාකාරකම් පිලිබඳව, විවිධ ක්‍රමවේදඔස්සේ එනම් හරස්කඩ චාරිකා, ද්විතීය දත්ත සහ කුඩා කණ්ඩායම් සාකච්ඡා මගින් තොරතුරු එකතු කර එල්ලංගා පැතිකඩක් සකස් කරඇත. මෙම පැතිකඩ එල්ලංගා පද්ධති කලමණාකරනයේදී මූලික අවශ්‍යතාවයකි.




එල්ලංගාව පවත්වාගෙන යාම සඳහා අතීතයේ පැවති ග්‍රාමීය ආයතන ව්‍යුහය හා සමාජ ආර්ථික වත් පිලිවෙත්,සම්ප්‍රදායන් හා චාරිත්‍ර වාරිත්‍ර නිසා එල්ලංගාවේ තිරසර පැවැත්ම තහවුරු වූ අතර ක්‍රමානුකූලව මෙම තත්වයන් වෙනස් වීමත් සමග එල්ලංගා පද්ධතිය හායනයට පත් වූ අතර වර්තමානය වන විට එය ඉතාමත් වේගයෙන් හායනයට ලක් වෙමින් පවතී. එල්ලංගා පද්ධති නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමේදී, සම්පත් හායනය වලක්වා ගැනීමේදී හා මනා කලමණාකරනයක් කිරීමේදී එල්ලංගාවේ වර්තමාන තත්වය සහ පවතින ගැටළු හා ඒවා අතර ඇති වඩාත් උග්‍ර ගැටළු හඳුනා ගැනීම ඉතාමත් වැදගත් වේ.මේ සඳහා එල්ලංගාවේ භූගෝලීය ගැටළු, ජල විද්‍යාත්මක ගැටළු, පරිසර විද්‍යාත්මක ගැටළු හා සමාජ ආර්ථික ගැටළු හඳුනා ගත යුතු වේ.එසේම එල්ලංගාව තුල වර්තමානයේ සිදුවන මානව ක්‍රියාකාරකම් පිලිබඳව, විවිධ ක්‍රමවේද ඔස්සේ එනම් හරස්කඩ චාරිකා, ද්විතීය දත්ත සහ කුඩා කණ්ඩායම් සාකච්ඡා මගින් තොරතුරු එකතු කර එල්ලංගා පැතිකඩක් සකස් කරනු ලැබිය. මෙම එල්ලංගා පැතිකඩ එල්ලංගා පද්ධති කලමණාකරනයේදී මූලික අවශ්‍යතාවයකි.

## 01.05. එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කිරීමේ අරමුණු

එල්ලංගා පද්ධතියේ සම්පත් ආරක්ෂා කිරීම සහ තිරසර පැවැත්ම තහවුරු කිරීම සඳහා එල්ලංගා කලමණාකරන වැඩසටහනක් දැඩි ලෙස අවශ්‍ය වී ඇත. එසේම එල්ලංගාවේ සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ඇතිව සුදුසු ආයතන ව්‍යුහයක් හරහා

ඒකාබද්ධව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගාව කලමණාකරනය කල යුතුවේ.ඒ සඳහා පහත අරමුණු ඉටු කර ගැනීම සඳහා එල්ලංගා පැතිකඩ සහකලමණාකරන සැලැස්මක් සකස් කරනු ලැබේ. ප්‍රධාන වශයෙන් භූගෝල විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, බෝග වගා රටාවන් සහ මානව ක්‍රියාකාරකම් නිසා එල්ලංගා පද්ධතියට වන හානි පිලිබඳ තොරතුරු සහ භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) උපයෝගී කරගෙන සකස් කරන ලද සිතියමක්ද, ඇතුලත් විස්තරාත්මක එල්ලංගා පැතිකඩ(Cascade (Profile) පාර්ශවකාර සංවිධාන වල ප්‍රයෝජනය සඳහා සැකසීම මගින් පාර්ශවකාර සංවිධාන වලට එල්ලංගාව සුරැකීමට පහසුකරණය කිරීම එල්ලංගා

පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු විසඳීම සඳහා වන උපායමාර්ගික මැදිහත්වීම්, ඒ සඳහා වන දල වියදම් ඇස්තමේන්තු, ක්‍රියාත්මක කිරීමේ කාලවකවානු සහ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා මැදිහත් වියයුතු පාර්ශවකාර ආයතනය මූලිකාංග ඇතුලත් එල්ලංගා පද්ධති කලමණාකරන මූලික සැලැස්මක් (Cascade Management Plan) සැකසීම. එල්ලංගා පද්ධතියේ වඩාත්උග්‍ර ගැටළු සහ ඒවා මගින් එල්ලංගා පද්ධතියට සිදු වී ඇති සහ සිදුවෙමින් පවතින හානි පිලිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින් හා පාර්ශවකරුවන් දැනුවත් කිරීම.

## 01.06. එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කලමණාකරන මූලික සැලැස්ම සැකසීමේ වැදගත්කම

එල්ලංගා පැතිකඩ, ස්වාභාවික හා මානව ක්‍රියාකාරකම් නිසා එනම් වර්ෂාව අඩු වීම, අවිධිමත් හේන් වගාව, වනාන්තර එලිපෙහෙලි කිරීම, සත්ව පාලන කටයුතු, කැලි කසල බැහැර කිරීම, පස් කැපීම, පතල් කැපීම සහ වැව් ආශ්‍රිත පරිසර පද්ධතිය විනාශ කිරීම යනාදී හේතු නිසා එල්ලංගාව හානියට පත්වී ඇති ආකාරය, එහිදි පාර්ශවකරුවන් වගකිව යුතු ක්ෂේත්‍ර හා ඔවුන්ගේ වගකීම් පිලිබඳව විවිධ මානයන් ඔස්සේ පාර්ශවකරුවන් හා ගොවි ප්‍රජාව අතර තොරතුරු හුවමාරු කරගැනීම සඳහා බෙහෙවින් ඉවහල් වේ. එල්ලංගා පැතිකඩ ප්‍රතිපත්ති සම්පාදකයින්ට, ප්‍රාදේශීය දේශපාලකයින්ට, පාර්ශවකාර ආයතන වලට සහ ගොවීන්ට එල්ලංගාව පිලිබඳව නිවැරදි පින්තූරය දැකීමට සහ එල්ලංගාව ආරක්ෂා කර ගැනීම සඳහා නිවැරදි තීරණ ගැනීමට තවදුරටත් වැදගත් වේ.එල්ලංගා පද්ධතිය ආරක්ෂා කර ගැනීමට සාමූහිකව හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කලමණාකරන මූලික සැලැස්මක් සැකසීම (Cascade Management Plan) සඳහා එල්ලංගා පැතිකඩ විශේෂයෙන්ම වැදගත් වේ.මෙහි සඳහන් මූලික එල්ලංගා කලමණාකරන සැලැස්ම එල්ලංගා කලමණාකරන කමිටුව විසින් සකස් කරන ලද එල්ලංගා පැතිකඩ පදනම් කරගෙන සකස් කර ඇත.

## 01.07. එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීමේ දී අනුගමනය කරන ලද ක්‍රමවේදය

පලාපත්වල එල්ලංගාවේ පවතින තත්වය දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් විශ්ලේෂණය කිරීමෙන් පසුව එල්ලංගාව ආරක්ෂා කර ගැනීම සඳහා එල්ලංගා කලමණාකරන කමිටුවේ අවශ්‍යතාවය තහවුරු විය. මෙම අරමුණ ඉටුකර ගැනීමට සහභාගීත්ව ප්‍රවේශයකින් යුත් එල්ලංගා කලමණාකරන සැලැස්මක් අවශ්‍ය බවද දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියට අවබෝධ විය. එල්ලංගා කලමණාකරන කමිටුවට විධිමත් එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කලමණාකරන සැලැස්මක අවශ්‍යතාවය දැනෙන්නට විය. මේ අනුව ඒල්ලංගාව අධ්‍යනය කිරීමටත් දත්ත හා තොරතුරු ඒක් රැස් නකරමින් එල්ලංගා පැතිකඩක් සකස් කිරීමටත් අප්ශ්‍ය විය. පිළිවෙලින් එල්ලංගාව අධ්‍යනය කිරීම හා ද්විතීය හා ප්‍රාථමික දත්ත හා තොරතුරු එකතු කිරීම, තොරතුරු ජනනය කිරීම එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ පූර්ව අවශ්‍යතාවයක් විය. ඒහිදී එල්ලංගා කළමනාකරණ සැලැස්මක් සකස් කිරීම.

ක්ෂේත්‍ර මූලික ක්‍රියාකාරකම් ඇතුලත් බහුවිධ කාර්යයකි. ඒ සඳහා එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීමට පෙර එල්ලංගා පැතිකඩසකස් කල යුතු අතර එහිදී එල්ලංගාවේ භූ විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, සිතියම් විද්‍යාත්මක හා සමාජ පැතිකඩ තක්සේරු කිරීම සඳහා සහභාගීත්ව




හා බහුපාර්ශවීය ක්‍රමවේද භාවිතා කරනු ලබයි. දත්ත විශ්ලේෂනය, වාර්තාලිවීම, සැලැස්ම සැකසීම සහ පාර්ශවකරුවන් මගින් ඒවායේ නිවැරදිභාවය තහවුරු කරගැනීම සඳහා බහුවිධ දක්ෂතා ඇති පුද්ගලයින් අවශ්‍ය වේ. මෙම සියලුම කාර්යයන් ලෝක බැංකු කාර්යමණ්ඩලයේ උපදෙස් ඇතිව දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් විසින් ඉටුකරනු ලැබීය. එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසිම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය සහ හවුල්කාර ආයතන එකතු වීපහත ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී.

(i) රැස්වීම් පැවැත්වීමට
(ii) ද්විතීය දත්ත එකතු කිරීම
(iii) හරස්කඩ චාරිකාව වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර ප්‍රාථමික දත්ත උත්පාදනය කිරීම
(iv) එල්ලංගාව මුහුණ දෙන අභියෝග හඳුනා ගැනීම
(v) එකතු කරන ලද හා උත්පාදනය කරන ලද දත්ත හා තොරතුරු මත පුරෝකථන කිරීම
(vi) එල්ලංගා පැතිකඩ සැකසීම
(vii) ගැටළු ගස වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර උග්‍ර ගැටළු හඳුනා ගැනීම,යුගල සැසඳීම වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර කඩිනමින් අවධානය යොමු කල යුතු උග්‍ර ගැටළු හඳුනා ගැනීම
(viii) එල්ලංගා සැලැස්ම සැකසීම
(ix) පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් එල්ලංගා කලමණාකරන සැලැස්මේ නිවැරදිතාවය තහවුරු කිරීම

(x) එල්ලංගා කලමණාකරන කමිටුවේ විශේෂ රැස්වීමකදී උග්‍ර ගැටළු විසඳීම හෝ අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් සහ ප්‍රධාන ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සහ යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා දළ ඇස්තමේන්තුවක් හා කෙටිකාලීන (Short Term), මධ්‍යකාලීන(Medium Term) හා දීර්ගකාලීන(Long Term) වශයෙන් බෙදා වෙන් කරන ලද ප්‍රායෝගික කාලවකවානු, එල්ලංගා කළමණාකරන කමිටුවට පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට හැකිවන ලෙස එල්ලංගා කළමනාකරණ සැලැස්මට ඇතුලත්වේ.

## 02. පලාපත්වල එල්ලංගා පද්ධතිය

පලාපත්වල එල්ලංගාව පිහිටා ඇත්තේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ යාපහුව මැතිවරණ කොට්ඨාශයේ පිහිටි අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් භූමි ප්‍රදේශය තුලවන අතර අඹන්පොල එහි ප්‍රධාන නගරය ලෙස සැලකේ. කුරුණෑගල සිට අනුරාධපුරය දක්වා දිවෙන ප්‍රධාන මාර්ගයේ කුරුණෑගල සිට කිලෝමීටර් 60ක පමණ දුරින් පිහිටා ඇති අඹන්පොල ඓතිහාසික රාජධානියක් වන යාපහුවට නුදුරින් පිහිටාඇත. පුරාවෘත වලට අනුව ඓතිහාසික වශයෙන් වැදගත්වන අනුරාධපුරය දක්වා ගමන්මාර්ගයේ අතරමග නවාතැන්පොලක් හෙවත් අම්බලමක් පිහිටි ස්ථානය පසුව අම්බලන්පොළ ලෙසද ඉන්පසු තවදුරටත් ව්‍යවහාරයේදී අම්බලන්පොළ උච්චාරණ පහසුව උදෙසා අඹන්පොළ ලෙස හඳුන්වන ලද බවත් ලේඛනවල සඳහන්වේ.

පුරාවිද්‍යාත්මකව හා ඓතිහාසික වශයෙන් වැදගත් ස්ථාන රැසක්ම අඹන්පොල අවට පිහිටාඇත. වර්තමානයේ අඹන්පොල නගරයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මෙන්ම ගොවිජනසේවා මධ්‍යස්ථානයක්ද පිහිටා ඇති අතර බැංකු හා වානිජ මධ්‍යස්ථානයක් ලෙස නගරය පුළුල් වෙමින් පවතී. කුරුණෑගල සිට අනුරාධපුරය දක්වා දිවෙන ඒ ශ්‍රේණියේ ප්‍රධාන මාර්ගයත්, අඹන්පොල සිට නිකවැරටිය දක්වා දිවෙන මාර්ගයත්, අඹන්පොල සිට ඇහැටුවැව දක්වා දිවෙන මාර්ගයත් අඹන්පොල නගරය හරහා වැටී ඇත.කොළඹ කොටුව කන්කසන්තුරේ දක්වා දිවෙන දුම්රිය මාර්ගය ද අඹන්පොල දුම්රිය ස්ථානයද මෙම කොට්ඨාසයේ පිහිටා ඇත.කෙකටිය ඇළ අඹන්පොල නගරයට ආසන්නව ගමන් කර ඉගිනිමිටිය ජලාශයට ගලා බසී. අඹකොලවැව හා මැඩියාව යන මහා වාරි දෙකක් හා සුළු වාරි රාශියක් ද අමුණු රැසක්ද ඇත. වියළි කලාපයට අයත් කටු පඳුරු සහිත ළඳු කැලෑ කොට්ඨාසය පුරා දක්නට ඇත.උතුරු හා නැගෙනහිර මායිමෙන් මී ඔය ගලා බසී.

මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් පරිපාලන රාජකාරි ආවරණය වූ මෙම ප්‍රදේශය වෙනම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් ලෙස 1988 වර්ෂයේදි මහව ප්‍රාදේශීය සභාවේ අඹන්පොල ප්‍රාදේශීය සභා උප කාර්යාලයේ උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් ලෙස කටයුතු ආරම්භ කරන ලද අතර අනුරාධපුර කුරුණෑගල ප්‍රධාන මාර්ගයේ පිහිටි නව ස්ථිර දෙමහල් ගොඩනැගිල්ල වෙත 2000.08.06 වන දින ප්‍රවිෂ්ඨ විය. දුෂ්කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වලින් එකක් වන මෙහි ජනගහනය 28921ක් වන අතර ගම් 122කින් සමන් විත වේ.

## 02.01.අඹන්පොල භූගෝලීය පිහිටීම




අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය කුරුණෑගල දිස්ත්‍රික්කයේ උතුරු මායිමේ පිහිටා ඇති අතර උතුරින් ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ද,දකුණින් මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ද නැගෙනහිරින් ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ට ද මායිම් වන අතර බටහිර මායිම වන්නේ කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයයි. මෙහි භූමි ප්‍රමාණය වර්ග කිලෝ මීටර් 136.96ක් වේ .භූ විෂමතාවය අනුව සලකා බලන විට සමස්ථ භූමියම තැනිතලා ස්වරූපයක් ගනී.උපරිම උන්නතාංශය අඩි 315ක් වන අතර එය දකුණු මායිමට ආසන්නව පිහිටා ඇත.අවම උන්නතාංශය අඩි 212ක් පමණ වන අතර එය උතුරු මායිමේ මී ඔය ආසන්නයේ පිහිටා ඇත.

අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බල ප්‍රදේශයට අයත් භූමිය තැනිතලා භූමියක් වන අතර ජලවහන රටාව පිළිබඳ සලකා බැලීමේදී මී ඔය ප්‍රධාන තැනක් ගනී.එහි ශාඛා වන හිතෝ ඇල හා අඹගම්මන ඇල ජල වහනයේදි විශේෂ වේ. එමෙන්ම කුඩා හා මහා පරිමාණයේ වැව් රාශියක් ප්‍රදේශය පුරා ව්‍යාප්තව පවතී.වර්තමානයේදි කෘෂි ළිං හා නළ ළිං මගින් බොහෝ දුරට භූ ගත ජලය ලබා ගනී.

අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ග්‍රාම නිලධාරී වසම් 28ක් පිහිටා ඇති අතර ප්‍රධාන වාරිමාර්ග ව්‍යාපාර දෙකක් ද සුළු පරිමාණ වැව් 283ක්ද පිහිටා ඇත. මෙම කුඩා පරිමාණයේ වැව් රාශිය අතර එකිනෙක මත යැපෙන එල්ලංගා පද්ධතීන් සමුහයක් අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටා ඇති අතර පලාපත්වල එල්ලංගාව ඉන් ප්‍රධාන එකකි. අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ සුළු පරිමාණ වැව් 133ක් සම්බන්ධයෙන් එල්ලංගා පද්ධති 22ක් පිහිටා ඇති අතර ඉන් විශාලතම එල්ලංගා පද්ධතිය වැව් 27කින් සමන්විත පිදුරුවල්ලව වන අතර පලාපත්වල එල්ලංගාව වැව් 11කින් සමන්විතවේ. ඉන් 10ක් නවීකරණයකර භාවිතයට ගනී.

| ජලය ලබා ගන්න මාර්ගය | වගා කල භූමි ප්‍රමාණය (අක්කර) |
|---|---|

| | මහ කන්නය (2022-2023) | යල කන්නය (2023) | එකතුව |
|---|---|---|---|
| මහා වාරි මාර්ග (අක්කර.අඩි 800 වැඩි) | 1048.30 | 701.3 | 1749.6 |
| මධ්‍ය වාරි මාර්ග (අක්කර.අඩි 200-800) | - | - | - |
| සුළු වාරි මාර්ග (අක්කර.අඩි 200 අඩු) | 1742.06 | 795.05 | 2537.11 |
| අහස්දියෙන් | 503.55 | 38.25 | 541.8 |
| උස්සාන වාරි | - | - | - |
| එකතුව | 3293.91 | 1534.6 | 4828.51 |

වගු අංක 01 - අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වී වගාව සඳහා ජලය ලබා ගැනීම

මේ අනුව සුළුවාරිමාර්ග ඇතුලත් එල්ලංගා පද්ධතිවල දායකත්වය ඉතා වැදගත් බව පෙනීයයි.

## 02.02.පලාපත්වල එල්ලංගාව

පලාපත්වල යනු පැරණි යාපහුව රාජධානිය පැවති සමයේදී රජ වාසලට පලා වර්ග සපයනලද ප්‍රදේශය බවට ජනවහරේ ඇති බව ගොවීන් සමඟ කරන ලද සාක්ච්චාවල දී සඳහන් කරනලදී. එමෙන්ම පුරාණයේදී මාතලේ ප්‍රදේශයේ ඇති පලාපත්වල ගම්මානයේ පහුවරයකු දේශපාලන රැකවරණ පතා යාපහුවට පැමිණි අතර ඔහුට ප්‍රධානය කරන ලද ප්‍රදේශය පලාපත්වල ලෙස හඳුන්වන ලද බවට අදහසක්ද ගොවීහු ප්‍රකාශ කළහ. පළාපත්වල සහ වරාගම්මනය ග්‍රාම නිලධාරී වසම් දෙකක් හා ඒවාට අයත් ගම්මාන රැසක් පලාපත්වල එල්ලංගා පද්ධතියට ඇතුලත් වේ.

වගු අංක 02 - එල්ලංගාව පිළිබඳ සාමාන්‍ය තොරතුරු

| තොරතුරු | විස්තරය |
|---|---|
| දිස්ත්‍රික්කය | කුරුණෑගල |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | අඹන්පොළ |
| මැතිවරණ බල ප්‍රදේශය | යාපහුව |
| ගංගා ද්‍රෝණියේ නම | මීඔය ගංගා ද්‍රෝණිය |
| එල්ලංගාවේ නම | පළාපත්වල |
| ගොවිජන සේවා බල ප්‍රදේශය | අඹන්පොළ |
| ග්‍රාම නිලධාරී වසම් | පළාපත්වල , වරාගම්මන |
| එල්ලංගාවේ මුලු භූමි ප්‍රමාණය හෙක්: | 754 Ac |
| ජලපෝශක ප්‍රදේශයේ නම | |
| පැහැදිලි ජල පෝෂක සංඛාව | |
| කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතා කරණ වැව් සංඛ්‍යාව | 10 |
| වනාන්තර ප්‍රදේශ | 102.3(AC) |
| මුඩු බිම් | 99.8 (AC) |
| එල්ලංගාව තුල ජීවත්වන පවුල් සංඛ්‍යාව | 593 |

## 02.02.01 පළාපත්වල එල්ලංගාව  හා එහි  පිහිටීම

කුරුණෑගල දිස්ත්‍රික්කයේ යාපහුව මැතිවරණ කොට්ඨාශයේ අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අඹන්පොල ගොවිජන සේවා බල ප්‍රදේශයේ ග්‍රාම නිලදාරී කොට්ඨාස 02 ආවරණය කරමින් පළාපත්වල එල්ලංගාව මුහුදු මට්ටමේ සිට  මීටර් 72.9ක පමණ උන්නතාංශයකින් පිහිටා ඇත. පළාපත්වල එල්ලංගාව මී ඔය ද්‍රෝණියේ පිහිටා ඇත. ගොවි සංවිධාන 10ක් සහ (GN ) ග්‍රාම නිලධාරී කොට්ඨාශ 2කින් එල්ලංගාව ආවරණය කරයි. පළාපත්වල එල්ලංගාව වැව් 11කින් සමන්විතය. ව්‍යාපෘතිය ආරම්භයේදී වැව් 10ක් ප්‍රතිසංස්කරණය සඳහා ව්‍යාපෘතිය මගින් තෝරාගෙන ඉදිකිරීම් 90 % පමණ අවසන් කර ඇත කර ඇත. මෙම එල්ලංගාව හෙක්  කින් සමන්විත වේ.

වගු අංක 03 - ග්‍රාම  නිලධාරී කොට්ඨාශ මට්ටමින් පළාපත්වල එල්ලංගාව

| ග්‍රාම නිලධාරී වසම් | පළාපත්වල | වරාගම්මන |
|---|---|---|
| ජනගහණය ස්ත්‍රී<br>පුරුෂ | 352<br>368 | 540<br>387 |
| පවුල් සංඛ්‍යාව | 269 | 324 |
| කෘෂි කාර්මික කටයුතුවල යෙදෙන සංඛ්‍යාව | 184 | 251 |
| වෙනත් රැකියාවල යෙදෙන සංඛ්‍යාව | 329 | 309 |

සිතියම 01 - පලාපත්වල එල්ලංගාවේ පිහිටීම



## 02.03. ජල විද්‍යාත්මක පදනම

පලාපත්වල එල්ලංගාව හරහා ගමන් කරනු ලබන විශේෂ ජල මූලාශ්‍ර නැති අතර එය කුඩා ජල ධාරාවන් කිහිපයක් මගින් පෝෂණය වේ. ඒවායේ වැසි කාලයට පමණක් ජලය ගලා බසින අතර වියළි කාලයේදි සිඳී යයි. පහත සඳහන් වර්ෂාපතන රටාව අනුව එල්ලංගාවේ ජලාශ වල ජල ධාරිතාවය උච්චාවචනය වේ.

වගු අංක 04- කලාපයේ උෂ්නත්ව අගයන් මාසිකව

| මාසය | වර්ෂය | | | |
|---|---|---|---|---|
| | 2020 | 2021 | 2022 | 2023 |
| ජනවාරි | 33.4 | 35.1 | 34.6 | 29.2 |
| පෙබරවාරි | 33.7 | 32.5 | 32.1 | 30.5 |
| මාර්තු | 35.5 | 34.4 | 30.7 | 33.1 |
| අප්‍රේල් | 34.8 | 33.0 | 31.6 | 34.4 |
| මැයි | 34.7 | 32.7 | 32.6 | 33.1 |
| ජූනි | 34.4 | 32.7 | 33.0 | 33.4 |
| ජූලි | 34.7 | 33.3 | 33.9 | 33.2 |
| අගෝස්තු | 34.5 | 34.8 | 35.3 | 34.9 |
| සැප්තැම්බර් | 33.9 | 34.1 | 33.6 | 32.2 |
| ඔක්තෝබර් | 33.7 | 31.3 | 31.9 | 31.7 |
| නොවැම්බර් | 33.8 | 30.1 | 30.6 | 31.3 |
| දෙසැම්බර් | 34.6 | 31.1 | 32.2 | 29.8 |

මූලාශ්‍රය -කාලගුණවිද්‍යා දෙපාර්තමේන්තුව

සමීක්ෂණ වලට අනුව පලාපත්වල එල්ලංගාව මී ඔය ද්‍රෝණියේ උපකොට්ඨාශ 3හි පිහිටා ඇති අතර මැඩියාව කාලගුණ මධ්‍යස්ථානයට ආසන්නව පිහිටාඇත. විශේෂිත ජාලසම්පාදන මූලාශ්‍රයක් නොමැති අතර මුළුමනින්ම වර්ෂාකාලයේදී ලැබෙන ජලය මගින් පෝෂණයවේ. වියළි කලාපිය දේශගුණයක් සහිත මෙම කොට්ඨාසයට වර්ෂාව ලැබෙනුයේ මෝසම් හා සංවහන වර්ෂා මගිනි.ඊසාන දිග මෝසම් වර්ෂාව මගින් සැප්තැම්බර් මස සිට පෙබරවාරි දක්වා වැඩි වර්ෂාපතනයක් ලැබෙන අතර,සංවහන වර්ෂාව මාර්තු අප්‍රේල් මාස වලදි ලැබේ. වියළි කලාපිය දේශගුණයක් සහිත මෙම කොට්ඨාසයට වර්ෂාව ලැබෙනුයේ මෝසම් හා සංවහන වර්ෂා මගිනි. ඊසාන දිග මෝසම් වර්ෂාව මගින් සැප්තැම්බර් මස සිට පෙබරවාරි දක්වා වැඩි වර්ෂාපතනයක් ලැබෙන අතර,සංවහන වර්ෂාව මාර්තු අප්‍රේල් මාස වලදි ලැබේ.

වගු අංක 05 - වර්ෂාපතනය අගයන් (මිලිමීටර)

| මාසය | වර්ෂය | | | |
|---|---|---|---|---|
| | 2020 | 2021 | 2022 | 2023 |
| ජනවාරි | 4.1 | 80.3 | 21.4 | 52.8 |
| පෙබරවාරි | - | - | 65.5 | 140.4 |

| | | | | |
|---|---|---|---|---|
| මාර්තු | - | 51 | 23.5 | 116.3 |
| අප්‍රේල් | 127.0 | - | 63.3 | - |
| මැයි | - | 360.4 | 163.2 | 97.7 |
| ජූනි | 28.6 | - | 21.5 | 5.1 |
| ජූලි | 151.9 | - | 157.8 | 9.2 |
| අගෝස්තු | 48.7 | - | 90.3 | 9.5 |
| සැප්තැම්බර් | 155.2 | - | 22.6 | 189.8 |
| ඔක්තෝබර් | 45.7 | 289.7 | 159.6 | 223.3 |
| නොවැම්බර් | 237.6 | 368.29 | 221.0 | 690.5 |
| දෙසැම්බර් | 249.8 | - | 148.6 | 252.1 |

මූලාශ්‍රය -කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

ප්‍රදේශයේ වාර්ෂික වර්ෂාපතන රටාව අනුව හා ඉහත සදහන් ස්ථාන වල වර්ෂාපතන මානයන්ගේ දත්ත අනුව  ජූලි අගෝස්තු සැප්තැම්බර් මාස වල ඉතා අවම වර්ෂාපතනයක් පෙන්නුම් කරයි. මෙම දත්ත විශ්ලේෂණය එල්ලංගාවට ඉතා අවම වැස්සක් ලැබෙන බව කිවහැකිය. මෙම තත්වයන් සැලකිල්ලට ගෙන සදුසු වගා සැලැස්මක් තීරණය කල යුතුය.

## 02.04. ඉඩම් පරිහරණ රටාව

පසෙහි ස්වභාවය මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පස පිළිබද සලකා බැලිමේදි පාංශු බාණ්ඩ තුනක් මෙම ප්‍රදේශයේ දැකිය හැකිය. දූර්වල ජල වහනයක් පවතින රතු දුඹුරු පස,රතු දුඹුරු පසෙහි ක්ෂාරිය නොවන දුඹුරු පස හා දියළු පස එම පස් වර්ග වේ.

පලාපත් වල එල්ලංගාව තුල වැව් 10ක් පවතින අතර එම වැව් වලට අදාළ සමස්ත පෝෂිත ප්‍රදේශය අක්කර 379ක් පමණ වන අතර වී වගාව සඳහා කුඹුරු අක්කර 37.5ක් යොදාගනී. වැව්වල සමස්ත ජාලධාරිතාවය අක්කර 62.1ක් වන අතර කැලෑ ඉඩම් අක්කර 102ක් සහ මුඩුබිම් අක්කර 100ක් පමණ ඇත. මුඩු ඉඩම් වර්ෂා කාලයේදී හේන් වගාව සඳහා යොදාගනී.

වගු අංක 06 - ඉඩම් පරිහරණ රටාව (ප්‍රමාණයන් අක්කර වලින්)

| අංකය | වැවේ නම | පෝෂිත ප්‍රදේශය | කැල | වී වගාව කුඹුරු | ජල ධාරිතාව | ඉදි කිරීම් | මුඩුබිම් |
|---|---|---|---|---|---|---|---|
| 01 | ගලටබැඳී වැව | 28.4 | 6.3 | 0.0 | 1.7 | 7.3 | 13,2 |
| 02 | මීගහ වැව | 17.6 | 5.6 | 0.0 | 1.2 | 6.0 | 4.9 |
| 03 | අඹගහ වැව | 40.5 | 10.1 | 1.1 | 2.7 | 12.2 | 14.4 |
| 04 | කටුපිටිගම වැව | 78.1 | 12.3 | 10.8 | 12.1 | 17.1 | 25.8 |
| 05 | පලුගහහෙන වැව | 25.2 | 12.1 | 0.0 | 0.6 | 0.0 | 12.5 |
| 06 | පුංචිනයිදේ වැව | 26.7 | 17.1 | 1.2 | 1.6 | 2.4 | 4.4 |
| 07 | කුඹුක්ගැටේ ඉහලවැව | 30.6 | 4.0 | 2.1 | 3.4 | 19.1 | 2.2 |
| 08 | කුඹුක්ගැටේ මැදවැව | 23.2 | 4.8 | 3.3 | 2.7 | 3.7 | 8.7 |
| 09 | කුඹුක්ගැටේ වැව | 21.4 | 9.8 | 1.4 | 5.3 | 0.0 | 5.0 |
| 10 | පලාපත්වල වැව | 87.0 | 20.6 | 17.8 | 30.9 | 9.1 | 8.6 |
| | | | | | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | එකතුව | 378.7 | 102.3 | 37.5 | 62.1 | 77.0 | 99.8 |

## 02.05.සමාජ ආර්ථික පසුබිම

පලාපත්වල එල්ලන්ගාවට අයත් ග්‍රාම නිලධාරී වසම් වන වදුරස්ස හා පලාපත්වලට අයත් ගම්මාන වන නැකති වදුරස්ස, පරසංඝිලියාගම, පහල කුඩාවත්ත, වල්පාලුව, වදුරැස්ස, කරුවලගස්වැව, තම්මැන්නැව, කලුපෙරුමාව, පලාපත්වල, දෙමටැව, ඌරැව සහ කුඹුක්ගැටේ යන ගම්මාන ඇතුලත්ය. එල්ලංගාව පලාපත්වල හා වරාගම්මන යන ග්‍රාම නිලධාරී වසම් වලට අයත් භූමි ප්‍රදේශය තුල පිහිටාඇත. එහි සමස්ත ජනගහනය 1647ක් වන අතර මුළු පවුල් සංඛ්‍යාව 593කි. ජනගහනයෙන් 9ක්ම බෞද්ධ ආගමිකයින්වන අතර මුස්ලිම් හා හින්දු ආගමිකයන් ඉතා සුළු පිරිසක් සිටිති. ජනගහනයෙන් 30% කට වැඩි පිරිසක් කෘෂිකර්මය ජීවනෝපාය කරගෙන සිටින අතර අනෙකුත් අයකම්කරු, මේසන් , වඩු කුලීවැඩ ඇතුළු විවිධ රැකියාවල යෙදෙති.

එල්ලංගා පද්ධතිය තුල ජීවත්වන සමස්ත ජනගහනය 1647ක් වන අතර මුළුමනින්ම වාගේ සිංහල බෞද්ධයන් වන අතර මුස්ලිම් හා හින්දු පවුල් 3කට අයත් පුද්ගලයින් 8 දෙනෙකු සිටින බව ග්‍රාම නිලධාරී වාර්ථාවල සඳහන්ය. රාජ්‍ය අංශයේ සේවය කරන පුද්ගලයන් 146 දෙනෙකු සහ පුද්ගලික අංශයේ සේවය කරන 190ක්ද කෘෂිකර්මයේ යෙදෙන සංඛ්‍යාව 453ක් බවතත් දැක්වේ.සෙසු අය ශ්‍රමිකයන් රැකියා නොකරණ හා වැඩිහිටි ජනගහනයයි. විදේශ රැකියා වල නියුතු වූවන් 7ක් පමණ වන අතර විශ්‍රාමිකයන් 28කි. මුළු පවුල් වලින් 25%ක්ම මාසික අදායම රුපියල් 10,000ට අඩු බවද සඳහන්වේ.

## 02.06. කෘෂිකාර්මික භෝග රටාව

පලාපත්වල එල්ලංගාවට අයත් මුළු බල ප්‍රදේශය අක්කර 759කි. එහි වැව් 10ක් පිහිටා ඇත. එම වැව්වල දල වශයෙන් අක්කර 38ක් පමණ මහ කන්නයේ කුඹුරු වගා කරයි. ගොඩ බෝග වගාව අක්කර 100ක් පමණ වන්නේ හේන් වගාවත් සමගයි. එම ගොවීන් සංඛ්‍යාව 435ක් පමණ වේ.කුඹුරු හා ගොඩ බෝග වගා නොකරන එහෙත් කෘෂි ආශ්‍රිත කටයුතු වල නිරතවන සංඛ්‍යාව 3ක් පමණ වේ. ගොවීන් වී වගාව හරුණු විට ගොඩ බෝග වගාවේ නිරතව ඇත වැව් ආසන්නයේ හේන් වගාව දක්නට ඇතත් මෙවායේ

වගාව මහ කන්නයට පමණක් සීමා වේ. මෙම වගාවේ අස්වැන්න නෙලන තුරු සතුන්ගෙන් වගාව ආරක්ෂා කර ගැනීමට මහත් පරිශ්‍රමයක් දැරීමට ගොවීන්ට සිදුවී ඇත. විශේෂයෙන් වන අලින්ගෙනි. ගොඩ ඉඩම් වටා වගා ආරක්ෂිත අගල් යෙදීම ක්‍රමයෙන් ව්‍යාප්ත වෙමින් පවතී. මෙය භූමි දර්ශණයේ සිදුවෙමින් පවතින නව වෙනස්වීමකි. එල්ලංගාව තුල එකම වර්ගයේ වෘක්ෂලතා දක්නට ඇත. කොට්ඨාශයේ කෘෂි ලිං 35ක් ඇත. හෙක්ටයාර් 61ක් පමණ එළවලු කෙසෙල් හා වෙනත් භෝග වගා කෙරේ. වර්ෂා කාලයේදී ගොඩ හා මඩ ඉඩම් වල එලවලු හා වෙනත් අතිරේක භෝග වගා කරන අතර වර්ෂා කාලයේදී සියලු කුඹුරු ඉඩම්වල වී වගා කරනු ලබයි.පලාපත්වල එල්ලංගාව යටතේ වැව් 10ට අයත් පෝෂිත ප්‍රදේශය තුල කෘෂිකර්මයේ යෙදෙන

පවුල් මෙන්ම වර්ෂා කාලයට ගොඩ හා මඩ ඉඩම්වලද භෝග වගාකෙරේ. එල්ලංගාව තුලම පදිංචි පවුල් එල්ලංගාවට පිටතින් පදිංචිව සිටින නමුත් එල්ලංගාව තුල වගා කටයුතු කරගෙනයන පවුල් 15ක් පමණ සිටින බවද ග්‍රා.නි. වාර්තාවල සඳහන්ය. ස්ථිර බහුවාර්ෂික භෝග වන අඹ හා පොල් වැනි වගාවන් අශ්‍රිතව පවතින අතර කුඩා පරිමාණ වශයෙන් වගා කරනු ලබන කෙසෙල් හා පැපොල් වැනි වගාවන් තැනින් තැන දක්නට ලැබේ. දිවුල්, දොඩම් හා දෙහි වැනි ශාකයන් ද ගෙවතුවල දක්නට ඇත. පලාපත්වල හා වරාගම්මන යන ග්‍රාම නිලධාරී වසම් දෙකකින් සමන්විත එල්ලංගා පද්ධතිය තුල ජීවත් වන මුලු පවුල් සංඛ්‍යාව 593ක් වන අතර ජනගහනය 16ක් වේ. කෘෂිකාර්මික කටයුතුවල යෙදෙන සංඛ්‍යාව 435 පලාපත්වල එල්ලංගා පද්ධතිය තුල ඇති වැව් වලට අදාලව කෘෂිකාර්මික ජනතාව විසින් ගොවි සංවිධාන පිහිටුවාගෙන ඇත. මේවාට අමතරව මරණාධාර සමිති වැනි වෙනත් ස්වෙඡ්වා සංවිධාන ද දකින්නට ඇත.

වගු අංක 07 -පලාපත්වල එල්ලංගාවට අයත් වැව් හා ගොවි සංවිධාන

| අංකය | වැවේ නම | ගොවි සංවිධානයේ නම |
|---|---|---|
| 01 | අඹගහ වැව | එකමුතු ගොවි සංවිධානය |
| 02 | ගලටබැඳි වැව | කොරුවේ ගම ගොවි සංවිධානය |
| 03 | කටුපිටිගම වැව | වරාගම්මන අරුණ ගොවි සංවිධානය |
| 04 | කුඹුක්ගැටේ වැව | පලාපත්වල ස්වර්ණ ගොවි සංවිධානය |
| 05 | කුඹුක්ගැටේ ඉහලවැව | තම්මැන්නාව එක්සත් ගොවි සංවිධානය |
| 06 | කුඹුක්ගැටේ මැදවැව | දෙමටවැව ගැමුණු ගොවි සංවිධානය |
| 07 | මීගහ වැව | ජනසෙත ගොවි සංවිධානය |
| 08 | පලාපත්වල වැව | පලාපත්වල ස්වර්ණ ගොවි සංවිධානය |
| 09 | පලුගස්හෙන වැව | දෙමටවැව ගැමුණු එක්සත් ගොවි සංවිධානය |
| 10 | පුංචිනයිදේ වැව | දෙමටවැව ගැමුණු ගොවි සංවිධානය |

කෘෂිකාර්මික භෝග වගාවන් සම්බන්ධව පහත සඳහන් ගැටළු පවතින බව ගොවීහු පෙන්වාදෙති.

1. වන අලි හානි/වෙනත් සත්තව හානි
2. වී වගාව සඳහා නිෂ්පාදන වියදම අධිකවීම
3. අස්වැන්න අඩුවීම
4. වර්ෂාව හිඟකම
5. ස්ථිර මිලක් නොමැතිවීම
6. පොහොර මිල ඉහලයාම
7. දේශගුණික විපර්යාස
8. ශ්‍රම හිඟය/ තරුණ ප්‍රජාව ගොවිතැන සඳහා දක්වන දායකත්වයේ අඩුකම
9. ජල හිඟය

විශේෂයෙන් ම වී වගාව ප්‍රවර්ධනය සඳහා ගොවීන් සහ ගොවි සංවිධාන මඟින් පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරන ලදී.

1. බිත්තර වී බීජ නොමිලේ ගොවීන් වෙත නිකුත් කිරීම.

2. නිසි කාලයට වගා කිරීම.
3. වී වගාවට අවශ්‍ය නව තාක්ෂණික ක්‍රම භාවිතය.
4. පැළ විසිරීම් තාක්ෂණය ප්‍රචලිත කිරීම.
5. කෘෂි උපකරණ සහන මිලට ලබාදීම
6. ස්වයං බිත්තර වී නිෂ්පාදනයට ගොවීන් හුරු කිරීම.
7. තාක්ෂණික ක්‍රම හඳුන්වාදීම(පැරෂුට්)
8. අලෙවි පහසුකම් ලබාදීම
9. සෘතුමය විදුලිවැට
10. ගොවිපල යාන්ත්‍රීකරණය

භෝග වගාව ප්‍රවර්ධනය සඳහා කරන යෝජනා

1. වන සතුන්ගෙන් වන හානි සඳහා පිළියම් යෙදීම.
2. උසස් තත්ත්වයේ බීජ හඳුන්වාදීම.
3. තාක්ෂණික ක්‍රම හඳුන්වාදීම.
4. කෙටිකාලීන බෝග වර්ග හඳුන්වාදීම.
5. අලෙවි පහසුකම් ලබාදීම.
6. කෘෂි යෙදවුම් සහන මිලට ලබාදීම
7. තරුණ ප්‍රජාව ගොවිතැන සඳහා දිරිමත් කිරීම
8. හරිතාගාර වගාව සඳහා අඩු පොලී ණය ලබාදීම

සත්ව පාලනය හා සම්බන්ධ ගැටළු

- පෝෂ තෘණ සංස්ථාපනය සඳහා භූමිය හා ජල සම්පාදනය සඳහා පහසුකම් හිඟවීම
- වන අලි හානි /තර්ජන.
- ක්ෂේත්‍ර රාජකාරි ඉටු කිරිමට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් හිග විම.

සත්ව පාලනය සඳහා කෙරෙන යෝජනා

- වගා නොකරන ලද ඉඩම් පෝෂ තෘණ සංස්ථාපනය සඳහා ලබාදීම.

මූලාශ්‍රය - පශු වෛද්‍ය කාර්යාලය- අඹන්පොල

## 02.07.පරිසර විද්‍යාත්මක පසුබිම.

පලාපත්වල එල්ලංගාව ආශ්‍රිතව පරිසර පද්ධතිය මානව ක්‍රියාකාරකම් හේතුවෙන් බෙහෙවින් බලපෑමට ලක්ව ඇති බව ක්ෂේත්‍ර චාරිකා වලදී අනාවරණය විය. වැව්වල ඉහලින් පෝෂිත ප්‍රදේශය තුල සිදුවන විවිධ ක්‍රියාකාරකම් දැඩි බලපෑම් එල්ලකරන බව පෙනීයයි. මෙම කලාපය තුල පාංශු ඛාදනය උග්‍රව සිදුවන අතර වර්ෂා ජලය සමග ගලාවිත් වැව සහ ඇලවේලි ගොඩවී ජල ධාරිතාවය පහල ගොස් ඇත.

භූගත ජල මට්ටම පහල යාමද අවිධිමත් බිම් සකස්කිරීම හා හේන් වගාව නිසා සිදුවන අතර මෙන්ම වැව් ඉස්මත්තේ සිදුවන කැලෑ කැපීම් හා ගිනිතැබීම් නිසා පරිසර පද්ධතියට බරපතල හානි සිදුව ඇති බවද දකින්නට ලැබුණි. වගාකරුවන් විසින් ස්වභාවික ජල පහරවල් හරස් කර තම වගාවන්ට ජලය ලබාගැනීම් නිසා වැව්වලට ගලා එන ජලය අවහිර වන අවස්ථාද දකින්නට තිබුණි. ජලාශවල ආක්‍රමණික ශාක පැතිරීයාමද බොහෝ වැව් වල දකින්නට තිබේ. විශේෂයෙන් ම මෙම තත්වය, පලාපත්වලවැව, කුඹුක්ගැටේ ඉහලවැව, කුඹුක්ගැටේ වැව, හාකටුපිටිගම වැවෙහි දක්නට ලැබේ. සියලුම වැව්වල කට්ටකඩුව අනවසරයෙන් වගා කිරීම් හේතුවෙන් බලවත් හානියක් සිදුවන අතර වැව්වල පැවැත්මට බරපතල තර්ජන මතුව තිබේ. එමෙන්ම අවිධිමත් පරිහරණය හේතුවෙන් වැව් බැම්වලට හානි සිදුව

ඇතිබව පලාපත්වල වැව, අඹගහ වැව හා කුඹුක්ගැටේ වැව තුලින් පැහැදිලිව දකින්නට තිබේ. වැව්වලට අයත් භූමි ප්‍රමාණය අල්ලාගෙන වගාබිම් මෙන්ම ස්ථිර ගොඩනැගිලි ඉදිකිරීම්ද කර ඇත. වැව ඇතුළු අනතුරුදායක ගැඹුරු වලවල් පිහිටීම නිසා මිනිස් ජීවිතවලට අනතුරු දායකතත්වයක් පලාපත්වල වැව ඇතුළු වැව් කීපයකම පවතින බව ගොවීහු ප්‍රකාශ කරති.

කෙසේ වුවද මෑතකදී එල්ලංගා පැතිකඩ සංවර්ධනය සඳහා සිදු කරනු ලැබූ සහභාගීත්ව ක්‍රමවේදයක් වන හරස්කඩ චාරිකාව හා අදාල ලේඛණ පරිශීලනය මගින් එකතු කරන ලද, ජනනය කරන ලද දත්ත හා තොරතුරු තුලින් එල්ලංගාවේ විවිධ අංශ විවිධ හේතු නිසා හානියට පත් වෙමින් පවතින බව අනාවරනය විය. කෙසේ වුවද එල්ලංගාවේ පිහිටිවැව් 11න් 10ක් එල්ලංගා සංවර්ධන ප්‍රවේශය (Cascade Development Approach) උපයෝගී කරගෙන ප්‍රතිසංස්කරණය කරනු ලබන අතර එහිදී මුළු පද්ධතියේ තිරසර පැවැත්ම තහවුරු වන ආකාරයට එල්ලංගාව සංවර්ධනය සඳහා විශේෂ අවධානයක් යොමු කරයි.

වගු අංක 08 - පළතුරු භෝග වගාව

| භෝගය | බිම්ප්‍රමාණය (අක්කර) | | වාර්ෂික නිෂ්පාදනය (කි.ග්‍රෑ) |
|---|---|---|---|
| | තනි වගාවක් ලෙස | අතුරු වගාවක් ලෙස | |
| අන්නාසි | - | 0.8 | 8000 |
| කෙසෙල් | 55 | 40 | 16000 |
| අඹ | 26 | 21.8 | 8000 |
| පැපොල් | 23 | 8 | 12600 |
| දොඩම් | 4 | 6 | 3200 |
| කොමඩු | - | - | 15000 |
| කජු | - | - | - |
| ඩ්‍රැගන් ෆෲට් | - | - | - |
| වෙනත්(පේර) | 3 | 6.8 | 1500 |

CSIAP - PRA

වගු අංක 09 - පලාපත්වලඑල්ලංගාවටඅයත්වැව්

| අංකය | වැවේනම | ගොවිපවුල්ගණන | පෝෂිත ප්‍රදේශය(අක්කර) |
|---|---|---|---|
| 01 | අඹගහ වැව | 5 | 2.43 |
| 02 | ගලටබැඳි වැව | 4 | 1.21 |
| 03 | කටුපිටිගම වැව | 6 | 3.64 |

| | | | |
|---|---|---|---|
| 04 | කුඹුක්ගැටේ වැව | 6 | 4.04 |
| 05 | කුඹුක්ගැටේ ඉහල වැව | 5 | 1.41 |
| 06 | කුඹුක්ගැටේ මැද වැව | 5 | 0.6 |
| 07 | මීගහ වැව | 6 | 3.23 |
| 08 | පලාපත්වල වැව | 15 | 25.7 |
| 09 | පලුගස්හෙන වැව | 5 | 0.4 |
| 10 | පුංචිනයිදේ වැව | 9 | 2.02 |

### 3. පළාපත්වල එල්ළංගාව තිරසර ලෙස කළමනාකරණය කිරීමේ වැදගත් කම

පලාපත්වල එල්ළංගාව හෙක්ටයාර් කින් සමන්විතය වැව් 11කින් යුක්ත වේ. මෙම වැව් අතරින් 10ක් ව්‍යාපෘතිය මගින් පුනරුත්ථාපනය කෙරේ. ඉතිරි වැව් අමුණු ද පුණරුත්ථාපනයට භාජනය කල යුතුව ඇත. පද්ධතිය තුල කුඹුරු හා අතිරේක ආහාර බෝග වගා කටයුතු වල නිරත වේ. මෙම සියලු දෙනා එල්ලංගාව තුල විවිධ මානුසික ක්‍රියාකාර කම් වල නිරතවේ . මේ අනුව එල්ලංගාව දැනටමත් විශාල හායනයකට පත්ව ඇත. කාලයක් තුල සිදුවී ඇති වණ විනාශය,හේන් වගාව, පාංශු ඛාදනය යන හේතුන් නිසාම වැව් හා ඇල පද්ධතිය ගොඩවීම නි සා එල්ලංගාව බලවත් තර්ජනයකට මුහුණ දෙමින් සිටී. වැව්වල ජලය සීග්‍රයෙන් සිදී ගොස් ඇත. ජල මාර්ග සිදී ගොස්ය. දේශගුණික විපර්යාශයන් අනුව මෙම තත්වය තව දුරටත් උග්‍රවනු ඇත. මෙම තත්වයෙන් මෙම එල්ලංගා ද්ධතිය බේරා ගැනීමටනම් වැව් පුණරුත්ථාපනය පමණක් කොහෙත්ම ප්‍රමාණවත් නොවේ. මෙම තත්වයට එකම විසඳුම වන්නේ සමස්ථ එල්ලංගාවම තිරසර සංවර්ධනයකට භාජනය කිරීමයි.ඒ අනුව එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කර එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ අවධානය යොමු කර ඇත.

### 03.01. එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමේ දී අනුගමනය කරන ලද ක්‍රමවේදය

දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, එල්ලංගාවේ පවතින තත්වය විශ්ලේෂණය කිරීමෙන් පසුව එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා සියලු පාර්ශවකාර ආයතන සම්බන්ධිත එල්ලංගා කලමණාකරන කමිටුව වැනි ආයතනයක අවශ්‍යතාවය තහවුරු විය.මෙම අරමුණ ඉටුකර ගැනීමට සඳහා එල්ලංගා කලමණාකරනය සඳහා ප්‍රධාන කාර්යයක් ලෙස විද්‍යානුකූල හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුත් එල්ලංගා කලමණාකරන සැලැස්මක් අවශ්‍ය බවට ද දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියට අවබෝධ විය. එල්ලංගා කලමණාකරන කමිටුවට විධිමත් එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කිරීමට එය උදව්වක් විය. පිලිවෙලින් එල්ලංගාව අධ්‍යනය කිරීම හා ද්විතියභා ප්‍රාථමික දත්ත හා තොරතුරු එකතු කිරීම,තොරතුරු ජනනය කිරීම එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ පූර්ව අවශ්‍යතාවයක් විය.

එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීම ක්ෂේත්‍ර මූලික ක්‍රියාකාරකම් ඇතුලත් බහුවිධ කාර්යයකි. ඒ සඳහා එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීමට පෙර එල්ලංගා පැතිකඩ සකස් කලයුතු අතර එහිදී එල්ලංගාවේ භූ විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, සිතියම් විද්‍යාත්මක හා සමාජ

පැතිකඩ තක්සේරු කිරීම සඳහා සහභාගීත්ව හා බහුපාර්ශවීය ක්‍රමවේද භාවිතා කරනු ලබයි. දත්ත උත්පාදනය, ත්‍රිමානකරණය, දත්ත විශ්ලේෂනය, වාර්තාලිවීම, සැලැස්ම සැකසීම සහ පාර්ශව කරුවන් ඒවායේ නිවැරදිභාවයතහවුරුකරගැනීමසඳහාබහුවිධදක්ෂතාඇති පුද්ගලයින් අවශ්‍ය වේ. මෙම සියලුම කාර්යයන් ලෝක බැංකු කාර්යමණ්ඩලයේ උපදෙස් ඇතිව දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් විසින් ඉටුකරනු ලැබීය. එල්ලංගා කලමණා කරන සැලැස්ම සැකසීම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය සහ හවුල්කාර ආයතන එකතු වී පහත ක්‍රියාමාර්ග අනුගමනය කරනලදී.

(i) රැස්වීම් පැවැත්වීමට
(ii) ද්විතීය දත්ත එකතු කිරීම
(iii) හරස්කඩ චාරිකාව වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර ප්‍රාථමික දත්ත උත්පාදනය කිරීම
(iv) එල්ලංගාව මුහුණ දෙන අභියෝග හඳුනා ගැනීම
(v) එකතු කරන ලද හා උත්පාදනය කරන ලද දත්ත හා තොරතුරු මත පුරෝකථන කිරීම
(vi) එල්ලංගා පැතිකඩ සැකසීම
ගැටළු ගස වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර උග්‍ර ගැටළු හඳුනා ගැනීම,යුගල සැසඳීම වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර කඩිනමින් අවධානය යොමු කල යුතු උග්‍ර ගැටළු හඳුනා ගැනීම
(viii) එල්ලංගා සැලැස්ම සැකසීම
(ix) පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් එල්ලංගා කලමණාකරන සැලැස්මේ නිවැරදිතාවය තහවුරු කිරීම
(x) එල්ලංගා කලමණාකරන කමිටුවේ විශේෂ රැස්වීමකදී උග්‍ර ගැටළු විසඳීම හෝ අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් සහ ප්‍රධාන ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සහ යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා දල ඇස්තමේන්තුවක් හා කෙටිකාලීන (Short Term), මධ්‍යකාලීන (Medium Term) හා දීර්ගකාලීන(Long Term) වශයෙන් බෙදා වෙන් කරන ලද ප්‍රායෝගික කාලවකවානු, එල්ලංගා කලමණාකරන කමිටුවට පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට හැකිවන ලෙස එල්ලංගා කමනාකරන සැලැස්මට ඇතුලත් කර ඇත.

පලාපත්වල එල්ළංගාව පැතිකඩක් සකස් කිරීමේ දී පහත සඳහන් ක්‍රමවේදයන් අනුගවනය කරනු ලැබීය එල්ළංගා කළමණාකරණ කමිටුවේ විශේෂ ර්‍ැවීමක දී එල්ළංගා පැතිකඩක අවශ්‍යතාවය හා ඊතුලින් එල්ළංගා සංවර්ධන සැලැස්මක් සකස් කර ක්‍රියාත්මකකිරීමේ අවශ්‍යතාවය සාකච්ජාවට ගනු ලැබීය . එම පැහැදිලි කිරීම් අනුව එල්ලංගා කළමණාකරණ කමිටුවේ සියලු සාමාජිකයින් මෙම හරස්කඩ චාරිකාව සංවිධානය කිරීමට එකගතාවය පල කරන ලදී. ඉන් අනතුරුව එල්ලංගා කළමණාකරන කමිටුවේ නියෝජිතයන් හා ගොවි සංවිදාන නියෝ ජිතයන් සමග එල්ලංගා හරස්කඩ චාරිකාව සැලසුම් කරන ලදී . මේ සඳහා යෝජිත දිනය ලෙස යොදා ගනු ලැබුවේ 2024 .02 .27 දිනයයි. මෙම චාරිකාව කණ්ඩායම් 4 කින් යුක්ත විය

2024. 02. 27 දින වැඩසටහන

**කණ්ඩායම් 01**

පලාපත්වල මහවැව හා ඊට අයත් කුඹුරු හා වැව ඉස්මත්ත ආවරණය කරමින් කිලෝමීටර් 03 ක් පමණ වූ ප්‍රදේශය

**කණ්ඩායම් 02**

ගලටබැදි වැව මීගහවැව අබයවැව කටුපිටිගම යන වැව් ආවරණය වන පරිදි එම වැව් ඉස්මත්ත රක්ෂිත ප්‍රදේශ ආවරණය වනසේ කිමී 5ක පමණ කලාපය.

**කණ්ඩායම් 03**

මෙම කණ්ඩායමට පලුගහහේන හා පුංචිනයිදේගේ වැව යන වැව් හා ඊට අයත්තදාසන්න ප්‍රදේශ අයත්විය. මෙම ප්‍රදේශය දුරින් කිමී 4ක පමණ විය.

**කණ්ඩායම් 04**

මෙම කණ්ඩායමට කුඹුක්ගැටේ ඉහල වැව හා කුඹුක්ගැටේ පහලවැව කුඹුක්ගැටේ මහවැව ආදීවූ කලාපය යොමු කලා. මෙහි ව්‍යාප්තිය කිමී 04ක් පමණ විය.

මෙදින ලබාගත් දත්ත නැවත එල්ලංගා කළමණාකරණ කමිටුවට හා ගොවි සංවිධානයට යොමුකර එම දත්ත වල නිවැදි තාවය සටහන් කර සංශෝධනය කරන ලදී . ගමන් මාර්ගයේ භූගෝලීය තොරතුරු, භූ විද්‍යාත්මක තොරතුරු, ජල විද්‍යාත්මක තොරතුරු, පරිසර විද්‍යාත්මක තොරතුරු, සමාජ ආර්ථික තොරතුරු සම්පත් හායනය හාසම්පත් හායනයේ බරපතලකම පිලිබඳව නිරීක්ෂණ හා සාකච්ඡා මගින් තොරතුරු එකතු කරගන්නා ලදී.

හරස්කඩ චාරිකාව සඳහා ප්‍රතිලාභීන් ගොවි සංවිධාන සාමාජිකයින් හා සියලු රාජ්‍ය ආයතනවල නිලධාරීන් සහභාගීවූ අතර චාරිකාවෙන් පසුව ඒ සඳහා සහභාගී වූ සියලුපාර්ශව වල සහභාගීත්වයෙන් වැඩමුළුවක් පවත්වා තොරතුරු වල නිරවද්‍යතාවය තවදුරටත් තහවුරු කරගන්නා ලදී. විශේෂයෙන්ම මෙම එල්ලංගා පැතිකඩේ ඇති තොරතුරු එල්ලංගා කලමණාකරන මූලික සැලැස්ම සැකසීම සඳහා ඉතාමත් වැදගත් වන අතර එල්ලංගාව අධ්‍යනය කරනු ලබන අයට එල්ලංගාව පිලිබඳව තොරතුරු ලබාගැනීමේ දී සහ එල්ලංගාවේ ඉදිරි සංවර්ධන කටයුතු සැලසුම් කිරීමට මග පෙන්වීමක්ද වන්නේය .

## 04. එල්ලංගාව මුහුණදෙන මූලික අභියෝග හඳුනා ගැනීම

පළාපත්වල එල්ලංගාව මුහුණදෙන ප්‍රධාන අභියෝග හඳුනා ගැනීම එල්ලංගා පැතිකඩ හා එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීමේ ක්‍රියාවලියේ කාර්යයන් අතර එක් ප්‍රධාන කාර්යයකි. දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන පළාත් 6ක දිස්ත්‍රික්ක 11ක එල්ලංගා පද්ධති 53ක් ආවරණය වන පරිදි එල්ලංගා කලමණාකරන කමිටු 53ක් පිහිටුවීමට පහසුකරනය කිරීමෙන් පසුව, ව්‍යාපෘතියේ ඊළඟ කාර්යය වී ඇත්තේ සෑම එල්ලංගා කලමණාකරන කමිටුවක් සඳහාම එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කර දීමට එල්ලංගා කළමනාකරණ කමිටුවට සහාය වීමයි.එල්ලංගාව සහ එල්ලංගාව මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීමට එල්ලංගා පැතිකඩ සැකසීම අතිශයින් වැදගත් වන අතර එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා ප්‍රායෝගික එල්ලංගා කලමණාකරන සැලැස්මක් සැකසීමට එල්ලංගා පැතිකඩ ඉතා වැදගත් වේ.ඒ අනුව අභියෝග හඳුනා ගත යුතු ප්‍රධාන ක්ෂේත්‍ර තීරණය කිරීම,දත්ත එකතු කිරීම හා උත්පාදනය කිරීම සඳහා අනුගමනය කළ

යුතු ක්‍රමවේද තීරණය කිරීම, එල්ලංගා පැතිකඩේ හා එල්ලංගා කලමණාකරන සැලැස්මේ දත්ත හා තොරතුරු ජනනය කිරීම සඳහා ආකෘති සැකසීම සම්බන්ධයෙන් දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් හා ලෝක බැංකු නිලධාරීන් එක්ව උපදේශන මට්ටමේ රැස්වීම් කීපයක්ම පවත්වන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලේඛණ පරිශීලනය කිරීමට අමතරව සහභාගීත්ව ක්‍රමවේදයක් වන හරස්කඩ චාරිකා ක්‍රමවේදය එල්ලංගාව අධ්‍යනය කිරීම සඳහා ප්‍රධාන ක්‍රමවේදයක් ලෙස භාවිතා කරන ලදී. එහි දී එල්ලංගා හරහා චාරිකා කරමින් එල්ලංගාවේ ස්වභාවය සහ ප්‍රධාන අභියෝග හඳුනා ගන්නා ලදී.

## 04.01. උග්‍ර ගැටළු විසඳීම/අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම්

වගු අංක 10 - උග්‍ර ගැටළු විසඳීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම

| අනු අංක | උග්‍ර ගැටළුව | යෝජිත උපාය මාර්ගික මැදිහත්වීම් | මැදිහත්වීම් |
|---|---|---|---|
| 1 | පලාපත්වල වම්ඇල ගොඩවීම නිසා කුඹුරු අක්කර 20 කට පමණ ජලය ලබාගත නොහැක. | • කොන්ත්‍රාත්කරුවන් පාර්ශවකරුවන් හා ව්‍යාපෘති නිධාරීන් සමග CMC හිදී සාකච්ජා කිරීම.<br>• CMC අනුමැතය ලබා ගැනීම<br>• ඇස්තමේන්තු කර පැවරීම ප්‍රගතිය මැන බැලීම. | 1. ගොවි සංවිධාන(CMC)<br>2. CSIAP<br>3. ගොවිජන සං. දෙ .<br>4. පළාත් වාරිමාර්ග දෙ. |

| | | | |
|---|---|---|---|
| 2 | පලාපත්වල සිට කුකුරුමාන්පිටිය දක්වා  පාර අබලන් | • අදාල ගොවී සංවිධාන  හා CMC හිදී සාකච්ඡා කිරීම<br>• ක්ෂේත්‍ර පරීක්ෂාවක් පවත්වා ස්ථාන හදුනා ගැ ීම.<br>• CMC අනුමැතය ලබා ගැනීම<br>• ඇස්තමේන්තු කර කොන්ත්‍රාත් පැවරීම පැවරීම<br>• ප්‍රගතිය මැන බැලීම . | 1. ගොවි සංවිධාන (CMC)<br>2. CSIAP<br>3. ගොවිජන සං දෙ<br>4. පළාත් වාරිමාර<br>5. ප්‍රාදේශීය සභාව |
| 3 | ජලාශවල ආක්‍රමණික ශාක පැතිරීම<br><br>(පලපත්වල වැව, කුඹුක්ගැටේ ඉහලවැව, කුඹුක්ගැටේ වැව, කටුපිටිගම වැව, කුඹුක්ගැටේ මැදවැව) | • CMC හිදී සාකච්ජාවට ගැනීම.<br>• ඇස්තමේන්ත කිරීම.<br>• ජලය අඩුවීමත් සමග නිර්දේශිත කෘමි. නාශකයක් යෙදීම.<br>• පවත්වාගෙන යාම. | 1. ගොවි සංවිධාන (CMC).<br>2. CSIAP.<br>3. ගොවිජන සං දෙ .<br>4. පළාත් වාරිමාර්ග දෙ.<br>5. ප කෘ දෙ . |
| 4 | කට්ටකඩුව හා වැව් රක්ෂිතවල පෙරහණය හා ගස් ගොම්මමන නැත.<br>(පලාපත්වල වැව, අඹගහ වැව, ගලටබැදී වැව, මීගහ වැව) | • CMC හිදී සාකච්ජාවට ගැනීම.<br>• අවශ්‍ය වැව් තෝරා ගැනීම ඇස්තමේන්තවක් සකස් කිරිම<br>• ගොවීන් දැනවත් කිරීම.  හා ගොවි සංවිඹාන  තෝරිගැනීම<br>• ඒකාබද්ධව කළුට්ටකාඩව වෙන් කිරීම.<br>• පැල සිටවීම සදහා ප්‍රතිපාන සපසා දීම කොන්ත්‍රිත් පැවරීම.<br>• අධීක්ෂණය. | 1. ගොවි සංවිධාන (CMC).<br>2. CSIAP<br>3. ගොවිජන සං දෙ .<br>4. පළාත් වාරිමාර්ග දෙ.<br>5. ප කෘ දෙ . |

| | | | |
|---|---|---|---|
| 5 | වැව බැම්ම හානි වී ඇත.<br>(පලාපත්වල, අඹගහ වැව, කුඹුක්ගැටේ වැව) | • CMC හිදී සාකච්ඡාකිරීම.<br>• තාක්ෂණික උපදෙස් ලබා ගැනීම.<br>• කාන්ත්‍රාත් කරුවන් හා ව්‍යාපෘති නිධාරීන් සමග සාකච්ඡාකිරීම .<br>• රුදවමම් මදල් මගින් ප්‍රතිපාදන සපයා ගැනීම .<br>• ගොවි සංවිධානය හෝ කාන්ත්‍රාත් කරුවන් මගින් අලුවැඩියා කිරීම . | 1. ගොවි සංවිධාන (CMC)<br>2. CSIAP<br>3. ගොවිජන සං දෙ<br>4. පළාත් වාරිමාර්ග දෙ.<br>5. ප කෘ දෙ . |
| 6 | පාංශුඛාදනය නිසා වැව ගොඩවීම | • CMC හිදී සාකච්ඡාවට ගැනීම.<br>• ස්ථාන හදනා ගැනීම.<br>• පාංශු සංරක්ෂණ වැටි සැලසම් කිරීම.<br>• ඇස්තමේන්තු කර අදාල ගොවීන්ට පැවරීම හා ප්‍රගතිය මැන බැලීම හා උපදෙස් ලබා දීම. | 1. ගොවි සංවිධාන (CMC)<br>2. CSIAP<br>3. ගොවිජන සං දෙ<br>4. පළාත් වාරිමාර්ග දෙ.<br>5. ප කෘ දෙ . |

| | | | |
|---|---|---|---|
| 7 | පලාපත්වල වැවේ වාන හරහා යන පාර නැත. | • CMC හිදී සාකච්ජාවට ගැනීම.<br>• ක්ෂේත්‍රය පරීක්ෂා කිරීම<br>• තාක්ෂණික උපදෙස් ලබා ගැනීම<br>• ප්‍රතිපාදන සපයා ගැනීම<br>• ගොවි සංවිධානය ශ්‍රමදානයක් මගින් නඩත්ත කිරීම | 1. ගොවි සංවිධාන (CMC).<br>2. CSIAP<br>3. ගොවිජන සං දෙ .<br>4. පළාත් වාරිමාර්ග දෙ.<br>5. ප කෘ දෙ . |
| 8 | වැව් වල රක්ෂිත අනවසරයෙන් අල්ලා ගැනීම | • CMC හිදී සාකච්ජාවට ගැනීම.<br>• රක්ෂිත අණවසරයෙන් අල්ලා ගත් ගොවීන්ගේ ලේඛණයක් සෑදීම. හා ඔවන් දැනවත් කිරීම.<br>• රක්ෂිත මැන වෙන් කිරීම.<br>• රක්ෂිතය සළකුණ කිරීම පැල සිටවීම . | 1. ගොවි සංවිධාන(CMC).<br>2. CSIAP<br>3. ගොවිජන සං දෙ .<br>4. පළාත් වාරිමාර්ග දෙ.<br>5. ප කෘ දෙ .<br>6. මිනින්දෝරැ දෙ . |
| 99 | සොරව් වලින් හා පැති බැම්වලින් ජලය කාන්දු වීම<br>(අඹගහ වැව, පලාපත්වල වැව, පලුගහහෙන වැව) | • CMC හිදී සාකච්ජා කිරීම.<br>• තාක්ෂණික උපදෙස් ලබා ගැනීම.<br>• කාන්ත්‍රාත් කරැවන් හා ව්‍යාපෘති නිධාරීන් සමග සාකච්ජා කර උපදෙස් ලබා දීම .<br>• රුදවමම් මදල් මගින් ප්‍රතිපාදන සපයා ගැනීම . | 1. ගොවි සංවිධාන (CMC)<br>2. CSIAP<br>3. ගොවිජන සං දෙ<br>4. පළාත් වාරිමාර්ග දෙ |

| | | | |
|---|---|---|---|
| 10 | වැව්වල රොන්මඩ ඉවත් කරන ලද පස් වැව තුළ ගොඩ ගසා තිබීම<br>(පලාපත්වල වැව සහ කුඹුක්ගැටේ ඉහල වැව) | • CMC හිදී සාකච්ඡා කිරීම<br>• තාක්ෂණික උපදෙස් ලබා ගැනීම.<br>• කාන්ත්‍රාත් කරුවන් හා ව්‍යාපෘති නිධාරීන් සමග සාකච්ඡා කිරීම භාරුදවම් මදල් මගින් ඉටුකිරීම | 1. ගොවි සංවිධාන (CMC)<br>2. CSIAP<br>3. ගොවිජන සං දෙ<br>4. පළාත් වාරිමාර්ග දෙ |
| 111 | කොන්ත්‍රාත්කරුවන් රොන්මඩ ඉවත්කිරීමේ දී වැව තුල අනතුරුදායක ගැඹුරු වලවල් හාරා ඇත. | • CMC හිදී සාකච්ඡා කිරීම<br>• තාක්ෂණික උපදෙස් ලබා ගැනීම.<br>• කාන්ත්‍රාත් කරුවන් හා ව්‍යාපෘති නිධාරීන් සමග සාකච්ඡා කිරීම හා රුදවමම් මදල් මගින් ප්‍රතිපාදන සපයා ගෙන ඉටකිරීම | 1. ගොවි සංවිධාන (CMC)<br>2. CSIAP<br>3. ගොවිජන සං දෙ<br>4. පළාත් වාරිමාර්ග දෙ |
| 112 | අනවසර ගොඩනැගිලි ඉදිකිරීම් (පලාපත්වල වැවේ වාන අසල) | • CMC හිදී සාකච්ඡා කිරීම<br>• අදාළ පුද්ගලයන් හදනා ගැනීම<br>• දැනම් දීම හා තිනීමගින් පියවර ගැනීම. | 1. ගොවි සංවිධාන(CMC)<br>2. CSIAP<br>3. ගොවිජන සං දෙ<br>4. පළාත් වාරිමාර්ග දෙ |
| 113 | නාන මංකඩ නැත.<br><br>(පලාපත්වල, කටුපිටිගම වැව, මීගහ වැව) | • CMC හිදී සාකච්ඡා කිරීම<br>• තාක්ෂණික උපදෙස් ලබා ගැනීම.<br>• ෙකාන්ත්‍රාත්ඇස්තමේන්තු කිරීම<br>• ගොවිසංවිධා මගින් ඉටුකිරීම | 1. ගොවි සංවිධාන (CMC)<br>2. CSIAP<br>3. ගොවිජන සං දෙ<br>4. පළාත් වාරිමාර්ග දෙ |

| | | | |
|---|---|---|---|
| | | | |
| 114 | පලාපත්වල වැවේ ගොඩ කුඹුරු අක්කර 15 පමණ ජලය ලබාගත නොහැක | • CMC හිදී සාකච්ඡා කිරීම<br>• සුදුසු වගා වැඩ සටහනක් සැල සුම් කිරීම. | 1. ගොවි සංවිධාන (CMC)<br>2. CSIAP<br>3. ගොවිජන සං දෙ .<br>4. පළාත් වාරිමාර්ග. |
| 115 | වාරිමාර්ග පද්ධතියේ නඩත්තු කටයුතු දුර්වලයි.<br>තනකොල කපන යන්ත්‍ර ලබාදීම | • CMC හිදී සාකච්ඡා කිරීම<br>• නඩත්තු වැඩසටහනක් සැලසුම් කිරීම.<br>• ගොවි සංවිධානය මගින් ක්‍රියාත්මක කිරීම | 1. ගොවි සංවිධාන (CMC)<br>2. CSIAP<br>3. ගොවිජන සං දෙ .<br>4. පළාත් වාරිමාර්ග. |
| 116 | පලාපත්වල වැව් තාවුල්ලට අවිධිමත් ලෙස අපද්‍රව්‍ය හා කැලිකසළ බැහැර කිරීම | • CMC හිදී සාකච්ඡා කිරීම<br>• නඩත්තු වැඩසටහනක් සැලසුම් කිරීම. | |

## 04.02.උග්‍ර ගැටළු විසඳීම/අවම කිරීම සඳහා යෝජිත ක්‍රියාකාරී සැලැස්ම

වගු අංක 11 - උග්‍ර ගැටළු විසඳීම / අවම කිරීම සඳහා යෝජිත ක්‍රියාකාරී සැලැස්ම

| අනු අංක | උග්‍ර ගැටළුව හා ගැටළුව පවතින ස්ථාන | ඇස්තමේන්තු මුදල රු.මි. | 2024 වර්ෂය | | | 2025 වර්ෂය | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ඔක් | නෙ | දෙ | ජන | පෙ | මා | අ | මැ | ජුනි | ජුලි | අ | සැ | ඔ | නො | දෙ |
| 01 | පලාපත්වල වම්ඇල ගොඩවීම නිසා කුඹුරු අක්කර 20කට පමණ ජලය ලබාගත නොහැක | 0.5 | | | | | | | | | | | | | | | |
| 02 | පලාපත්වල සිට කුකුරුමාන්පිටිය දක්වා පාර අබලන් | 0.5 | | | | | | | | | | | | | | | |
| 03 | ජලාශවල ආක්‍රමණික ශාක පැතිරීම<br><br>(පලපත්වල වැව, කුඹුක්ගැටේ ඉහලවැව, කුඹුක්ගැටේ වැව, කටුපිටිගම වැව, කුඹුක්ගැටේ මැදවැව) | | | | | | | | | | | | | | | | |
| 04 | කට්ටකඩුව හා වැව් රක්ෂිතවල පෙරහණය හා ගස් ගොම්මන නැත. (පලාපත්වල වැව, අඹගහ වැව, ගලටබැදී වැව,මීගහ වැව.) | 0.5 | | | | | | | | | | | | | | | |

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 05 | වැව් බැම්ම හානිවී ඇත.<br>(පලාපත්වල, අඹගහ වැව, කුඹුක්ගැටේ වැව) | 0.0 | | | | | | | | | | | | | | | |
| 06 | පාංශුඛාදනය නිසා වැව ගොඩවීම | 3.0 | | | | | | | | | | | | | | | |
| 07 | පලාපත්වල වැවේ වාන හරහා යන පාර නැත. | 1.0 | | | | | | | | | | | | | | | |
| 08 | වැව්වල රක්ෂිත අනවසරයෙන් අල්ලා ගැනීම | 0.5 | | | | | | | | | | | | | | | |
| 09 | සොරොව් වලින් හා පැති බැම් වලින් ජලය කාන්දු වීම<br>(අඹගහ වැව, පලාපත්වල වැව, පලුගහහෙන වැව) | 0.0 | | | | | | | | | | | | | | | |
| 10 | වැව්වල රොන්මඩ ඉවත් කරන ලද පස් වැව තුළ ගොඩගසා තිබීම<br>(පලාපත්වල වැව සහ කුඹුක්ගැටේ ඉහල වැව) | 0.0 | | | | | | | | | | | | | | | |
| 11 | අනවසර ගොඩනැගිලි ඉදිකිරීම් (පලාපත්වල වැවේ වාන අසල) | 0.0 | | | | | | | | | | | | | | | |
| 12 | නාන මංකඩ නැත.<br>(පලාපත්වල, කටුපිටිගම වැව, මීගහ වැව) | 1.5 | | | | | | | | | | | | | | | |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 13 | පලාපත්වල වැවේ ගොඩ කුඹුරු අක්කර 15 පමණ ජලය ලබාගත නොහැක | 0.5 | | | | | | | | | | | | | | |
| 14 | වාරිමාර්ග පද්ධතියේ නඩත්තු කටයුතු දුර්වලයි. | 0.5 | | | | | | | | | | | | | | |
| 15 | පලාපත්වල වැව් තාවුල්ලට අවිධිමත් ලෙස අපද්‍රව්‍ය හා කැලිකසල බැහැර කිරීම | 0.3 | | | | | | | | | | | | | | |
| | **එකතුව** | **7.05** | | | | | | | | | | | | | | |

**ඇමුණුම**

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

கமநல அபிவிருத்தித் திணைக்களம்

DEPARTMENT OF AGRARIAN DEVELOPMENT

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | 7/3/9/CMC/2023 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2023.08. 03 |

චක්‍රලේඛ අංකය - 06/2023

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

<u>එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීම හා පවත්වා ගෙන යාම.</u>

**<u>Cascade Management Committee (CMC) Establishment & Continuity</u>**

රට අභ්‍යන්තරයේ සිට මුහුදට ගලා බසින ප්‍රධාන ගංගා (Rivers) තෘතියික ජල මාර්ග ලෙසත්, එම ප්‍රධාන ගංගා වලට එකතුවන අතු ගංගා (Tributarite) ද්විතීක ජල මාර්ග ලෙසත්, එම අතු ගංගා වලට ජලය සපයන කුඩා ජල මාවත් (Small water ways) ප්‍රාථමික ජල මාර්ග ලෙසත් හැඳින්වේ. ග්‍රාමීය වැව් හා අමුණු වැඩි ප්‍රමාණයක් ප්‍රාථමික ජල් මාර්ග හරහා ඉදිකර ඇති අතර භූමිය මතුපිට ජලය ගබඩා කර පහළට ගලා යාමට සැලැස්වීමට සකස් කර ඇති වැව් ද මීට ඇතුළත් වේ.

02. මෙරට අභ්‍යන්තරයේ පවතින ප්‍රාථමික ජල මාර්ගයක් හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති, ජල විද්‍යාත්මක වශයෙන් එකට බැඳුණු කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ වැව් පද්ධති හෝ වැව් හා අමුණු පද්ධති හෝ අමුණු පද්ධති වලින් සමන්විත, මධ්‍යම ප්‍රමාණයේ ජල පෝෂක ප්‍රදේශයක් (Meso-catchment) එල්ලංගා පද්ධතිය ලෙස හැඳින්වේ.

03. ශ්‍රී ලංකාවේ එල්ලංගා පද්ධති 1166 ක් දැනට හඳුනාගෙන ඇත. මෙම එල්ලංගා පද්ධති ආශ්‍රිතව භූ විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක සහ සමාජ ආර්ථික ප්‍රගමණය උදෙසා සම්පත් භාවිතය කාර්යක්ෂමව හා තිරසරව පවත්වාගෙන යාම ඉලක්ක කරගනිමින් 1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) ආඥා පනතින් සංශෝධිත 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥා පනතේ 1 (අ) 1, 2, 3, 4 වගන්ති ප්‍රකාරව ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති බලතල අනුව සහ උක්ත පනත යටතේ පවත්වනු ලබන දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේදී වාරි කර්මාන්ත ආශ්‍රිත වි වගාව ඇතුළු කෘෂිකර්මයට බලපාන හෝ අනුෂාංගික සියලු කරුණු සම්බන්ධව කටයුතු කිරීමට උක්ත පනතෙන් ඔබ වෙත පැවරී ඇති බලතල අනුව එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු [Cascade Management Committee (CMC)] පිහිටුවීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් කෘෂිකර්ම කමිටුවේදී සමාලෝචනය කරන ලෙසත් ඊට පහත සඳහන් කරුණු මාර්ගෝපදේශ වශයෙන් යොදාගන්නා ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

<u>3.1. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීමේ පරමාර්ථ</u>

i. එල්ලංගාවක පිහිටි සියලු ස්වාභාවික සම්පත්, එනම් පස, ජලය, වන සම්පත, ජෛව පද්ධති, ඉඩම් හා වාරිමාර්ග පද්ධති කළමනාකරණය කිරීම සඳහා ප්‍රතිලාභීන් සහ අදාළ රාජ්‍ය නිලධාරීන් ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කිරීම සඳහා ආයතනික ව්‍යුහයක් සකස් කිරීම.

ii. වාරි කෘෂිකර්මය, පශු සම්පත් කටයුතු සහ මිරිදිය ධීවර කර්මාන්තය, සඳහා ජලය සැපයීම, වන සම්පත හා වන ජීවී අවශ්‍යතා තුලනාත්මකව පවත්වාගෙන යාම, භූගත ජල මට්ටම ප්‍රශස්ත ලෙස පවත්වාගෙන යාම, ගෙවතු වගාව ඇතුළු ගෘහස්ථ ජල අවශ්‍යතාවයන් විධිමත් ලෙස කළමනාකරණය කිරීම.

iii. කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය භාවිතා කරන්නන් ඇතුළුව එල්ලංගා පද්ධතිය නඩත්තු කිරීම සඳහා අනෙකුත් පරිශීලකයන්ගේ සහ පාර්ශවකරුවන්ගේ දායකත්වය ලබාගැනීම.

## 3.2. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීමේ අරමුණු

i. එල්ලංගා පද්ධති කළමනාකරණය හා තිරසර පැවැත්ම සඳහා නීතිමය පිළිගැනීමක් සහිත ආයතනික ව්‍යුහයක් ඇති කිරීම.

ii. එක් එක් එල්ලංගා පද්ධති වලට අදාළව එහි ක්‍රියාකාරීත්වයට හා තිරසර පැවැත්මට අදාළ වන ගැටළු හා යෝජිත විසඳුම් ඒකාබද්ධ ප්‍රවේශයකින් යුක්තව සාකච්ඡා කර නීතිමය වශයෙන් පිළිගත් ක්‍රමවේදයක් ඇති කිරීම.

iii. එල්ලංගා පද්ධතිය තුළ පිහිටි වාරි කෘෂිකාර්මික, ජල කළමනාකරණ, පාරිසරික, සමාජ ආර්ථික හා භූ විද්‍යාත්මක සාධක පද්ධතියේ මනා ක්‍රියාකාරීත්වය සඳහා අඛණ්ඩව හා සක්‍රියව පවත්වාගෙන යාමට ක්‍රමවේදයක් ඇති කිරීම.

iv. එල්ලංගා පද්ධතියේ සංවර්ධන කටයුතු වලදී, මුළු පද්ධතියට සිදුවන හායනයන් වලක්වා ගනිමින් අවශ්‍යතා තහවුරු කිරීම, ජල සම්පත් කාර්යක්ෂමව පරිහරණය සඳහා වගා කන්න පදනම් කර ගනිමින් සැලසුම් සකස් කිරීම.

v. එල්ලංගා පද්ධතිය සඳහා ඒකාබද්ධ කෘෂිකාර්මික නිෂ්පාදන සැලැස්මක් සකස් කිරීම හා එම සැලැස්මෙ ක්‍රියාත්මක තත්ත්වය පසුවිපරම කිරීම.

vi. එල්ලංගා පද්ධතියක පැවතිය යුතු අංගෝපාංග ප්‍රතිස්ථාපනය සඳහා අවශ්‍ය කටයුතු කිරීම.

vii. එල්ලංගා පද්ධති හා බැඳුනු සමාජ ආර්ථික සම්බන්ධතා ආරක්ෂා කිරීම හා ඒ පිළිබඳව පාර්ශවකරුවන් දැනුවත් කිරීම

## 3.3. එල්ලංගා පද්ධති කලමනාකරණ කමිටුවේ කාර්යභාරය

i. එල්ලංගා පද්ධතිය සඳහා වන සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම.

ii. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු සාමාජිකයන් විසින් ඉදිරිපත් කරනු ලබන ගැටලු, යෝජනා සහ සැලසුම් සඳහා විසඳුම් ලබාදීම සහ විසඳිය නොහැකි ගැටලු අදාළ වන පරිදි ප්‍රාදේශිය / දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත යොමු කර විසඳා ගැනීම.

iii. එල්ලංගා පද්ධති කලමනාකරණයට අදාල වාර්තාවක් අවස්ථානුකූලව ප්‍රාදේශීය / දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත ඉදිරිපත් කිරීම.

iv. ග්‍රාමීය වැව් එල්ලංගාවන් තුළ පිහිටි සියලුම ජල මූලාශ්‍ර හා ජල පාරිභෝගිකයින් එක්ව එල්ලංගාව අයත් මධ්‍යම ජල පෝෂක ප්‍රදේශය (Meso-Catchment) සඳහා ඒකාබද්ධ කෘෂිකාර්මික සැලැස්මක් පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම.

v. එල්ලංගාවක් තුළ කටයුතු කරන සියලුම ජල පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා අනුව ජල පෝෂක ප්‍රදේශය තුළ පවතින ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාළ තිරණ ගැනීම හා ක්‍රියාත්මක කිරීම.

vi. ස්වභාවික ආපදා, ව්‍යසන හා හානිකර මානව ක්‍රියාකාරකම් අවම කරගැනීමට හැකිවන පරිදි සියලු ජල මූලාශ්‍ර කළමනාකරණය කිරීම.

vii. එල්ලංගාව තුළ පිහිටි සියලු ජල මූලාශ්‍ර ආශ්‍රිත ජල පාරිභෝගිකයන් අතර කාර්යක්ෂම තොරතුරු සන්නිවේදන ක්‍රමයක් ස්ථාපිත කිරීම.

viii. එල්ලංගාව තුළ ඇති පරිසර පද්ධති වලට අදාළ යෙදවුම් හා නිමවුම් ප්‍රශස්ත ලෙස කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

ix. පවතින හා ඉදිරියේදී ඇතිවිය හැකි බවට අනාවැකි පල කරන දේශගුණික විචලනයන් සඳහා යෝග්‍ය වූ දේශගුණික සුහුරු උපායමාර්ගික සැලසුම් ක්‍රියාවට නැංවීම සහ ජල පාරිභෝගිකයන් එවැනි දේශගුණික අනුගත වීම් වලට හුරු කිරීම.

x. එල්ලංගා පද්ධතිය තුළ ජල පාරිභෝගිකයන් අතර දැනුම, ආකල්ප, කුසලතාවයන් සහ සම්පත් ඵලදායි ලෙස හුවමාරු කරගැනීම.

xi. ජල පාරිභෝගියන්ගේ ඉඩම්, ජලය හා පරිසර පද්ධතිවල ඵලදායිතාවය ඉහළ නැංවීමට කටයුතු කිරීම.

xii. කෘෂිකර්මයට හා ජල පරිභෝජනයට අදාළ වන පරිසර පද්ධති හා සම්බන්ධ සාම්ප්‍රදායික නීති හා පනවන ලද නීති බලාත්මක කිරීමට අවශ්‍ය සහය ලබා දීම.

xiii. ඉඩම් හිමි ගොවීන්ගේ හා බුක්තිකරුවන්ගේ රැස්වීම (වගා කන්න රැස්වීම) පැවැත්වීම සඳහා අවශ්‍ය මූලික තීරණ ගැනීමට ගොවීන්ට සහාය වීම, ඊට අදාල සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම සහ පසුවිපරම් කිරීම.

xiv. එල්ලංගා පද්ධති බල ප්‍රදේශය තුළ සියලු ජල මූලාශ්‍ර සහ ඊට අනුබද්ධ අනිකුත් පරිසර පද්ධති වල තිරසර බව සඳහා අදාල රාජ්‍ය ආයතනවල මඟ පෙන්වීම හා උපදෙස් අනුගමනය කරමින් සංරක්ෂණය කරවීමට ක්‍රියාමාර්ග ගැනීම.

xv. එල්ලංගා පද්ධතියට හානිකරන පාර්ශවයන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.

xvi. එල්ලංගා පද්ධතියේ සැම සංවර්ධන ක්‍රියාවලියකදීම ඒ සඳහා ක්‍රියාකාරී ලෙස දායකත්වය ලබාදීම හා ප්‍රගති සමාලෝචනය කිරීම.

xvii. එල්ලංගා පද්ධතියේ වාරි කර්මාන්ත වල කන්න රැස්වීම් තීරණ ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය පසුවිපරම් කිරීම.

xviii. එල්ලංගා පද්ධතියේ වාරි කර්මාන්ත වල මෙහෙයුම් හා නඩත්තු වැඩසටහන පසුවිපරම් කිරීම.

## 3.4. එල්ලංගා පද්ධති කලමණාකරණ කමිටුවේ සංයුතිය

### 3.4.1 ප්‍රාදේශීය මට්ටම

මෙම කමිටුව අදාල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පහත නිලධරයන්ගෙන් සමන්විත වේ.

i. ප්‍රාදේශීය ලේකම්
ii. ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී
iii. කෘෂිකර්ම උපදේශක
iv. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් ඉංජිනේරු / තාක්ෂණික නිලධාරී
v. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් ප්‍රාදේශීය ඉංජිනේරු / තාක්ෂණික නිලධාරී
vi. කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර
vii. ග්‍රාම නිලධාරී
viii. සමෘද්ධි සංවර්ධන නිලධාරී
ix. ආර්ථික සංවර්ධන නිලධාරී
x. ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xi. පළාත් ධීවර දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xii. ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ නියෝජිතයෙකු
xiii. පරිසර අධිකාරියේ නියෝජිතයෙකු
xiv. පොලිස් පරිසර ඒකකයේ නියෝජිතයෙකු
xv. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xvi. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ නියෝජිතයෙකු
xvii. වාරි මාර්ග ඉංජිනේරු/තාක්ෂණ නිලධාරී
xviii. වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xix. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xx. භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ නියෝජිතයෙකු
xxi. ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ නියෝජිතයෙකු
xxii. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xxiii. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xxiv. පළාත් පාලන ආයතන නියෝජනය කරමින් බලයලත් නිලධරයකු
xxv. ගොවි සංවිධාන, කාන්තා ගොවි සංවිධාන, නිෂ්පාදන ගොවි සංවිධාන නියෝජනය කරමින් එක් එක් ගොවි සංවිධානයේ සභාපති හෝ ලේකම්
xxvi. ප්‍රජා ජල සංවිධානයක නියෝජිතයෙක්

**xxvii.** වෙනත් ප්‍රජා සංවිධාන හා පරිසර සංවිධාන නියෝජනය කරමින් එක් සංවිධානයකින් එක් නියෝජිතයෙකු

3.4.2.<u>දිස්ත්‍රික් මට්ටම</u>

මෙම කමිටුව අදාල දිස්ත්‍රික්කයේ පහත නිලධරයන්ගෙන් සමන්විත වේ.

i. දිසාපති හෝ දිස්ත්‍රික් ලේකම්
ii. ප්‍රාදේශීය ලේකම්
iii. ගොවිජන සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස්
iv. පළාත් පාලන ආයතන නියෝජනය කරමින් පළාත් පාලන සහකාර කොමසාරිස් හෝ නියෝජිතයෙකු
v. දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂක
vi. පළාත් හා අන්තර් පළාත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂකවරුන්
vii. වාරි මාර්ග අධ්‍යක්ෂක හෝ ප්‍රධාන ඉංජිනේරු
viii. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නියෝජ්‍ය අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
ix. ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
x. පළාත් ධීවර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xi. ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xii. පරිසර අධිකාරියේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xiii. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xiv. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xv. වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xvi. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දිසා වන නිලධාරි හෝ නියෝජිතයෙකු
xvii. ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ දිස්ත්‍රික් භාර නිලධාරි හෝ ඉංජිනේරු
xviii. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xix. භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ නියෝජිතයෙකු
xx. ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී
xxi. පොලිස් පරිසර ඒකකයේ ස්ථාන භාර නිලධාරි
xxii. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xxiii. දිස්ත්‍රික් ගොවි සංවිධාන බලමණ්ඩලය නියෝජනය කරමින් සභාපති / ලේකම් හෝ නියෝජිතයෙකු
xxiv. ප්‍රජා ජල සංවිධාන භාර නිලධාරි හෝ දිස්ත්‍රික් නියෝජිතයෙකු
xxv. වෙනත් ප්‍රජා සංවිධාන හා පරිසර සංවිධාන වල දිස්ත්‍රික් මට්ටම් නියෝජනය කරමින් එක් සංවිධානයකින් එක් නියෝජිතයෙකු

***සැ:යු :- එල්ලංගා පද්ධති බලප්‍රදේශ සීමාව තුළ අදාළ ආයතනයේ බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී එම එක් එක් බල ප්‍රදේශය නියෝජනය කරමින් ඉහත අනුව බලයලත් නිලධාරීන් සහභාගී විය යුතුය.***

**3.5. එල්ලංගා පද්ධති කලමණාකරණ කමිටුවක නිලධාරී මණ්ඩලය - ප්‍රාදේශීය මට්ටම**

i. එල්ලංගා පද්ධතියට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී සහභාගී වන සෑම ප්‍රාදේශීය ලේකම්වරයෙක්ම කමිටුවේ සම සභාපති ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය.

ii. එල්ලංගා පද්ධතියට අදාල ගොවිජන සේවා බල ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී කමිටුවේ ලේකම් ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය. එල්ලංගා පද්ධතියට ගොවිජන සේවා බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවන්හි දී වැඩි පෝෂිත අක්කර ගණනක් පවතින බල ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී ලේකම් ලෙස කටයුතු කළ යුතුය.

iii. කමිටුවේ සභාපතිවරයාගේ උපදෙස් පරිදි ලේකම්වරයා විසින් රැස්වීම් කැඳවීම සිදු කළ යුතුය.

**3.6. එල්ලංගා පද්ධති කලමණාකරණ කමිටුවක නිලධාරී මණ්ඩලය - දිස්ත්‍රික් මට්ටම**

i. එල්ලංගා පද්ධතියට දිස්ත්‍රික් එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී සහභාගී වන සෑම දිස්ත්‍රික් ලේකම්වරයෙක්ම කමිටුවේ සම සභාපති ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය.

ii. එල්ලංගා පද්ධතියට අදාළ දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් කමිටුවේ ලේකම් ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය. එල්ලංගා පද්ධතියට ගොවිජන සේවා බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවන්හි දී වැඩි පෝෂිත අක්කර ගණනක් පවතින දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් ලේකම් ලෙස කටයුතු කළ යුතුය.

iii. කමිටුවේ සභාපතිවරයාගේ උපදෙස් පරිදි ලේකම්වරයා විසින් රැස්වීම් කැඳවීම සිදු කළ යුතුය.

04. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ තිරසර බව රඳා පවතින ප්‍රධාන අංගයක් වන ජෛව පද්ධති කළමනාකරණය සඳහා එල්ලංගා වාරිමාර්ග කළමනාකරණය විධිමත් කිරීම සඳහා පිහිටුවනු ලබන එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු [Cascade Management Committee (CMC)] තුළින් අපේක්ෂිත කාර්යභාරය ඉටුකරගැනීම සඳහා ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

ඒ.එච්.එම්.එල්.අබේරත්න
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්

පිටපත් :-

i. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශීය කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
ii. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
iii. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
iv. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය
v. පොලිස්පති, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව
vi. අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
vii. අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව
viii. අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
ix. අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
x. වන සංරක්ෂක ජනරාල්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

xi. අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
xii. අධ්‍යක්ෂ ජනරාල්, ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
xiii. අධ්‍යක්ෂ ජනරාල්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
xiv. අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
xv. අධ්‍යක්ෂ ජනරාල්, ජලජීවී වගා සංවර්ධන අධිකාරිය
xvi. අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම පරිසර අධිකාරිය
xvii. අධ්‍යක්ෂ ජනරාල්, භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය
xviii. සභාපති, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
xix. සමාන්‍යාධිකාරී, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය
xx. සියලුම පළාත් ලේකම් වරුන්, පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය
xxi. ලේකම්, පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය
xxii. සියලුම පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකවරුන්, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
xxiii. සියලුම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂකවරුන්, පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
xxiv. ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන් - CSIAP/ CRIWMP/ SARP
xxv. සියලුම ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස් වරුන්

(කාරුණික දැනගැනීමට සහ අවශ්‍ය කටයුතු සඳහා)